

# සමරිසි පුද්ගලයින් ඇතුළු විවිධ ලිංගික අනන්‍යතාවන් සහිත ප්‍රජාව පිළිබඳ මාධ්‍ය වාර්තාකරණය හා ආචාරධර්ම පිළිබඳ මාර්ගෝපදේශනයක්.

රචනය - තුෂාර මනෝජ්

EQUAL GROUND ආයතනයේ ප්‍රකාශනයකි.

# සංඥාපනය

මෙම පොත් පිංච ඔබ වෙත ගෙන එන්නේ EQUAL GROUND ආයතනයේ ප්‍රකාශනයක් ලෙස වන අතර EQUAL GROUND ආයතනය යනු ශ්‍රී ලංකාවේ එල්ජීබීටීඅයිකිව් (LGBTIQ) - සමරිසි කාන්තාවන්, සමරිසි පුරුෂයින්, ද්විරිසි කාන්තාවන් හා පුරුෂයින්, සංක්‍රාන්ති සමාජභාවීය පුද්ගලයින්, අන්තර් ලිංගික පුද්ගලයින් හා තම ලිංගික හා ස්ත්‍රී පුරුෂ සමාජභාවීය අනන්‍යතාවය කුමක්දැයි නිශ්චිතව හඳුනානොගත් පුද්ගලයින්ගේ මානව හිමිකම් ප්‍රවර්ධනය හා ආරක්ෂා කිරීම වෙනුවෙන් ක්‍රියාත්මක වන රාජ්‍ය නොවන සංවිධානයකි. EQUAL GROUND ආයතනය ශ්‍රී ලංකාවේ විවිධ ලිංගික අනන්‍යතා සහිත ප්‍රජාවගේ සිවිල්, දේශපාලනික, සංස්කෘතික, සමාජයීය හා නීතිමය අයිතිවාසිකම් වෙනුවෙන් ක්‍රියාකරන අතර එම ප්‍රජාවට අවශ්‍ය උපදේශනය ලබාදීම, දැනුවත් කිරීමේ වැඩමුළු පැවැත්වීම, ගොඩවැදීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම, ශිෂ්‍යත්ව අරමුදලක් පවත්වාගෙන යාම, සුබසාධන කටයුතු හා ඔවුන් වෙනුවෙන් රජය, පෞද්ගලික අංශය ඇතුළු විවිධ පාර්ශව සමග උද්දේශන කටයුතු සිදුකිරීම යනාදියෙන් සම්බන්ධ වේ. එමෙන්ම EQUAL GROUND ආයතනය දේශීය හා ජාත්‍යන්තර විවිධ සමුළු, වැඩමුළු, පුහුණු හා නියෝජනයන්හිදී විවිධ ලිංගික අනන්‍යතා සහිත ප්‍රජාව වෙනුවෙන් පෙනී සිටින අතර ඔවුන් වෙනුවෙන් අවශ්‍ය මැදිහත්වීම සිදුකරනු ලබයි.

විවිධ ලිංගික අනන්‍යතා සහිත කණ්ඩායම් සම්බන්ධයෙන් සමාජයේ පවතින මතයන් වෙනස් කිරීම මගින් එම ප්‍රජාවට නිදහසේ ජීවත්විය හැකි සමාජ ක්‍රමයක් සකස් කරදීමේ අරමුණින් මේ වන විට ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක 13 ක විවිධ වැඩසටහන් දියත් කර ඇති අතර එම වැඩසටහන් මගින්, ශ්‍රී ලංකා පොලීසිය, මානව හිමිකම් කොමිසන් සභාව, නීතිඥ මහත්ම මහත්මීන්, නීති ආධාර කොමිසම, මාධ්‍යවේදීන්, ග්‍රාම නිලධාරී මහත්ම මහත්මීන්, විශ්වවිද්‍යාල ශිෂ්‍යයින්, ග්‍රාමීය තරුණ සමිති හා සංගම්, සෞඛ්‍ය ක්ෂේත්‍රයේ නිලධාරීන් හා සාමාන්‍ය ප්‍රජාව විවිධ ලිංගික අනන්‍යතා සහිත ප්‍රජාව සම්බන්ධයෙන් දැනුවත් කර ඇත. ඒවායේ ප්‍රතිඵල ලෙස EQUAL GROUND ආයතනය ඇරඹි 2004 වර්ෂයට සාපේක්ෂව මේ වන විට විවිධ ලිංගික අනන්‍යතා සහිත ප්‍රජාව සම්බන්ධයෙන් විශාල වෙනස්කම් හා ප්‍රතිසංස්කරණ සමාජය තුළින් සිදුවෙමින් පවතී. එහෙත් විවිධ මූලධර්මවාදී කණ්ඩායම් විසින් ප්‍රචාරය කරනු ලබන අසත්‍ය හා අපහාසාත්මක ප්‍රකාශයන් මගින් දිනෙන් දින විවිධ ලිංගික අනන්‍යතා සහිත ප්‍රජාවට එරෙහිව සිදුවන හිංසන වැඩිවෙමින් පවතින බව අපගේ නිරීක්ෂණයයි. මේ සම්බන්ධයෙන් මාධ්‍ය ක්ෂේත්‍රය ඇතිකරන බලපෑමද සුළුපටු නොවේ. පසුගිය කාලසීමාව තුළ ශ්‍රී ලංකාවේ ජීවත්වන සමරිසි කාන්තාවන්, සමරිසි පුරුෂයින්, ද්විරිසි කාන්තාවන් හා පුරුෂයින්, සංක්‍රාන්ති සමාජභාවීය පුද්ගලයින්, අන්තර් ලිංගික පුද්ගලයින් හා තම ලිංගික හා ස්ත්‍රී පුරුෂ සමාජභාවීය අනන්‍යතාවය කුමක්දැයි නිශ්චිතව හඳුනානොගත් පුද්ගලයින් සම්බන්ධයෙන් මාධ්‍ය මගින් සිදුකරන ලද වාර්තාවන් පරිශීලනය කිරීමෙන් අපට තේරුම් ගියේ බොහෝ මාධ්‍ය වාර්තා කිසිදු ආකාරයක නිසි පරිශීලනයකින්, කරුණු සොයාබැලීමකින් හෝ විමර්ශනය කිරීමකින් තොරව පළකරන ලද හිතළු වන බවයි. විවිධ ලිංගික අනන්‍යතා සහිත ප්‍රජාව සම්බන්ධයෙන් මාධ්‍ය වාර්තාකිරීමේදී පැවතිය යුතු සංවේදීභාවය, මාධ්‍ය ආචාරධර්ම හා මානව හිමිකම් ආරක්ෂා කිරීම යනාදියෙන් තොරව, වාර්තා කරන අයගේ සමාජ හා සංස්කෘතික ආකල්ප මත පදනම්ව වාර්තා කිරීම මගින් සිදුවන්නේ සමරිසි කාන්තාවන්, සමරිසි පුරුෂයින්, ද්විරිසි කාන්තාවන් හා පුරුෂයින්, සංක්‍රාන්ති සමාජභාවීය පුද්ගලයින්, අන්තර් ලිංගික පුද්ගලයින් හා තම ලිංගික හා ස්ත්‍රී පුරුෂ සමාජභාවීය අනන්‍යතාවය කුමක්දැයි නිශ්චිතව හඳුනානොගත් පුද්ගලයින්ට සමාජයෙන් තව තවත් හිරිහැර ඇතිවීමයි.

මෙම පොත් පිංච නිර්මාණය කිරීමේ පසුබිම එක් පැත්තකින් නිවැරදි මාධ්‍ය වාර්තාකරණයට අවශ්‍ය මාර්ගෝපදේශනය ලබාදීම වන අතර, අනෙක් පසින් වැරදි ආකාරයෙන් මාධ්‍ය භාවිතා කිරීම වැළැක්වීම සඳහා අවශ්‍ය සංවේදීභාවය ඇතිකිරීමයි. මෙම පොත පරිශීලනය කිරීමෙන් පසුව ශ්‍රී ලංකාවේ විවිධ ලිංගික අනන්‍යතා සහිත ප්‍රජාව සම්බන්ධයෙන් ධනාත්මක හා නිර්මාණාත්මක මාධ්‍යකරණයක ඔබ නියැලේවි යැයි අපි අපේක්ෂා කරමු. සමරිසි කාන්තාවන්, සමරිසි පුරුෂයින්, ද්විරිසි කාන්තාවන් හා පුරුෂයින්, සංක්‍රාන්ති සමාජභාවීය පුද්ගලයින්, අන්තර් ලිංගික පුද්ගලයින්, තම ලිංගික හා ස්ත්‍රී පුරුෂ සමාජභාවීය අනන්‍යතාවය කුමක්දැයි නිශ්චිතව හඳුනානොගත් පුද්ගලයින් සම්බන්ධයෙන් මාධ්‍යයට ලිවීමේදී නිවැරදි වචන භාවිතා කරන්නේ කෙසේද යන්න සඳහා අවශ්‍ය පාරිභාෂික පද මාලාවක් මෙහි අඩංගුවන අතර, ලිංගිකත්වය යනු කුමක්ද, ලිංගිකත්වය හා ලිංගික දිශානතිය එකිනෙකින් වෙනස් වන්නේ කෙසේද හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය යනු කුමක්ද යන්න පිළිබඳ සංක්ෂිප්ත අදහස් දැක්වීමක් සිදුකර ඇත. එමෙන්ම මාධ්‍ය මගින් මාධ්‍ය ආචාරධර්ම හා මානව හිමිකම් සම්බන්ධයෙන් අවධානය යොමුකළ යුත්තේ ඇයිද යන්න එක් පරිච්ඡේදයකින් විස්තර කර ඇති අතර ඒ සඳහා පසුගිය කාලයේදී සිදුවූ මාධ්‍ය වාර්තාකරණයන්ගෙන් උදාහරණ කිහිපයක්ද දක්වා ඇත. අවසානයේ නිවරැදි ආකාරයෙන් හා වඩාත් විශ්වසනීය ආකාරයෙන් විවිධ ලිංගික අනන්‍යතා සහිත ප්‍රජාව සම්බන්ධයෙන් ලිවීමේදී, වාර්තාකිරීමේදී හෝ නිර්මාණ කිරීමේදී අනුගමනය කළ යුතුයැයි අප විශ්වාස කරන උපදේශන මාලාවක්ද දක්වා ඇත.

# පාරිභාෂික පදමාලාව

ග්ලෑඩ් මාධ්‍ය සහ පරිශීලන අත්පොත (www.glaad.org/reference) ලාංකේය සන්දර්භයට අනුගත වන සේ අනුවාදනය කර ඇත.

**ලිංගික දිශානතිය (Sexual Orientation)**

තමන්ගේම ලිංගයේ හෝ විරුද්ධ ලිංගයේ සාමාජිකයන් කෙරේ කාලයක් තිස්සේ පවතින කායික, මානසික හා ආධ්‍යාත්මික / රොමෑන්තික ආකර්ෂණය සඳහා භාවිතා වන විද්‍යාත්මකව නිවැරැදි නාමයයි. මෙයට සමරිසි පුරුෂයන්, සමරිසි ගැහැණු හා, ද්විරිසි ගැහැණුන් හා පුරුෂයන් සහ විෂමලිංගික ලිංගික දිශානතීන් අඩංගු වේ.

වාර්තා කිරීමේදී හෝ ප්‍රකාශ කිරීමේදී ලිංගික දිශානතිය වෙනුවට 'ලිංගික කැමැත්ත/තෝරා ගැනීම/නැඹුරු වීම' වැනි වැරැදි සහගත වචන භාවිතා කිරීම හරහා සමරිසි හෝ ද්විරිසි අනන්‍යතාවයන් "සුවකළ හැකිය" යන අදහස වක්‍රව ලබා දේ. තමන්ගේ ලිංගික දිශානතිය යනු කුමක්දැයි දැන ගැනීම හෝ තේරුම්ගැනීම යනු ඔවුන්ට මනසින් තමා රුචිකත්වයක් දක්වන්නේ කාහටද යන්න තේරුම්ගැනීමක් විනා, ඒ සඳහා කිසිදු ලිංගික අත්දැකීමක් ලබා තිබීම අවශ්‍යම වන්නේ නැත.

**විෂමලිංගික (Heterosexual)**

විරුද්ධ ලිංග සාමාජිකයන් කෙරේ කාලයක් තිස්සේ පවතින කායික, මානසික හා ආධ්‍යාත්මික/භාවාත්මක ආකර්ෂණයක් ඇති පුද්ගලයන් විස්තර කිරීමට භාවිතා වන විශේෂණ පදයකි.

**සමලිංගික (Homosexual)**

බොහෝ සමරිසි (Gay) පුද්ගලයන් සම්බන්ධයෙන් අපහාසාත්මක සහ අප්‍රසන්න වචනයක් ලෙස හඳුනා ගන්නා පැරණි සායනික වචනයකි. අන්තර්ජාතික තලයේ මාධ්‍ය ආයතන ගණනාවක් මෙම වචනයේ භාවිතාව සීමා කර ඇත. සිංහලෙන් 'සමරිසි' යන වචනය මෙය වෙනුවට හඳුන්වා දී ඇති අතර එයින් තමා අයත් ලිංගිකත්වයේම අයට ආකර්ෂණය වන පුද්ගලයන් නිවැරැදිව විස්තර කෙරේ.

**ගේ (Gay) - සමරිසි පුරුෂ**

පුරුෂයෙක් විසින් තවත් පුරුෂයෙකුට කායික, මානසික හා ආධ්‍යාත්මික/ භාවාත්මක වශයෙන් ඇතිවන ආකර්ෂණය විස්තර කිරීමට භාවිතා වන විශේෂණ පදයකි. යල්පැනගිය වදනක් යැයි සැලකෙන හා අපහාසාත්මක සහ වැරැදි සහගත අදහසක් ඇතිකරවන 'සමලිංගික' යන පදයෙන් සමරිසි පුද්ගලයන් හැඳින්වීමෙන් වලකින්න.

**ලෙස්බියන් (Lesbian) - සමරිසි ස්ත්‍රිය**

කාන්තාවක් විසින් තවත් කාන්තාවක් කෙරෙහි කායික, මානසික හා ආධ්‍යාත්මික/භාවාත්මක වශයෙන් සිදුවන ආකර්ශනය හැඳින්වීමට යොදාගන්නා පදයයි. ඉහතින් දැක්වූ ආකාරයටද වාර්තා කිරීමේදී ඔවුන් කෙරෙහි යම් අපහාසයක් ඇතිකරවන 'සමලිංගික' යන පදය භාවිතා කිරීමෙන් වළකින්න.

**බයිසෙක්ෂුවල් (Bisexual, Bi) - ද්විරිසි පුරුෂයින් හා ගැහැණුන්**

තමන්ගේ ලිංගයේම හෝ විරුද්ධ ලිංගයේ සාමාජිකයන් යන දෙකොට්ඨාශය කෙරේම කාලයක් තිස්සේ පවතින කායික, මානසික හා ආධ්‍යාත්මික/භාවාත්මක ආකර්ෂණයක් ඇති කර ගැනීමේ හැකියාවක් පවතින පුද්ගලයකු හැඳින්වීමට යෙදෙන වචනයකි. පුද්ගලයන් තමන්ගේ ජීවිත කාලය පුරා විවිධ අයුරින් සහ විවිධ ප්‍රමාණවලින් මෙය අත් විඳීමට ඉඩ ඇත. ද්විරිසි පුද්ගලයන්ට ද්විරිසි වීම සඳහා සුවිශේෂී ලිංගික අත්දැකීම් තිබිය යුතු නොවේ. ඇත්ත වශයෙන්ම තමන් ද්විරිසියෙකු යැයි හඳුනා ගැනීමට ඔවුනට කිසිදු ලිංගික අත්දැකීමක් අවශ්‍යම වන්නේ නැත.

# පාරිභාෂික පදමාලාව

**ලිංගිකත්වය (Sexuality)**

පුද්ගලයන් පුරුෂ හෝ ස්ත්‍රී ලෙස වර්ගීකරණය කිරීම යි. ළදරු කාලයේ දී කෙනෙකුගේ බාහිර කායික ලක්ෂණ අනුව ලිංගය පවරනු ලබයි (උප්පැන්න සහතිකයේ ලියැවෙන්නේ මෙයයි). කෙසේ වුවත්, පුද්ගලයකුගේ ලිංගය ඇත්ත වශයෙන්ම ක්‍රෝමසෝම, හෝමෝන, අභ්‍යන්තර සහ බාහිර ප්‍රජනන අවයව සහ ද්විතියක ලිංගික ලක්ෂණ ආදී කායික ලක්ෂණවල සංකලනයකි.

**ස්ත්‍රී පුරුෂ සමාජභාවීය අනන්‍යතාවය (Gender Identity)**

මෙය උපතින් ලැබුණු ලිංගිකත්වයට වඩා වෙනස් දෙයක් විය හැකිය. කිසියම් පුද්ගලයෙකුට උපතින් ලැබුණු ලිංගිකත්වය නොව, තම මනසට තමාව දැනෙන්නේ කෙසේද යන්න සමඟ මෙය සම්බන්ධ වේ. එනම් මානසිකව තමා පුරුෂයෙක්ද නැතිනම් ගැහැණියක්ද යන්න අවබෝධ කරගැනීම හා ඒ ආකාරයට පෙනී සිටීමයි. කෙනෙකුගේ ස්ත්‍රීපුරුෂ සමාජභාව සම්බන්ධව වන ගැඹුරින් දැනෙන සංවේදයයි.

**ස්ත්‍රී පුරුෂ සමාජභාව ප්‍රකාශනය (Gender Expression)**

කෙනෙකුගේ නම, සර්වනාම, ඇඳුම් පැළඳුම්, කොණ්ඩය කැපීමේ විලාසිතාව, චර්යාව, කටහඬ හෝ ශරීර ලක්ෂණ ආදී බාහිර අංගවලින් ස්ත්‍රී පුරුෂ සමාජභාවය විද්‍යාමාන කිරීමයි. සමාජය මෙවැනි සලකුණු පිරිමි ලක්ෂණ සහ ගැහැණු ලක්ෂණ ලෙස හඳුනා ගන්නා අතර, මෙම පිරිමි හා ගැහැණු ලක්ෂණ කාලයත් සමග සහ සංස්කෘතියට අනුව වෙනස් විය හැකිය. සංක්‍රාන්ති පුද්ගලයෝ තමන්ගේ ස්ත්‍රීපුරුෂ සමාජභාව ප්‍රකාශනය තමන්ට උපතේදී පවරනු ලැබූ ලිංගයට වඩා, තමන්ගේ ස්ත්‍රී පුරුෂ සමාජභාව අනන්‍යතාවය සමග ගැලපීමට උත්සාහ කරති.

**සංක්‍රාන්ති සමාජභාවී (Transgender)**

තමන්ගේ ස්ත්‍රී පුරුෂ සමාජභාවීය අනන්‍යතාවය සහ/හෝ ස්ත්‍රී පුරුෂ සමාජභාවීය ප්‍රකාශනය තමන්ට උපතේ දී පැවැරෙන ලිංගයට අනුරූප ලක්ෂණවලින් වෙනස්වන පුද්ගලයන් හැඳින්වීමට යෙදෙන පුළුල් පරාසයක් ආවරණය කරන පොදු වචනයකි. එසේත් නැතිනම් උපතින් ලිංගවල පිහිටීම අනුව ලැබෙන ලිංගිකත්වය නොව මනසින් ප්‍රතිවිරුද්ධ ලිංගයට අයත් යැයි දැනෙන හැඟීමයි. එලෙස තමන්ව හඳුන්වාගැනීමයි. ජීව විද්‍යාත්මකව මෙයට හේතු ලෙස දක්වන්නේ ලිංගික අවයව වලට අනුරූප ලෙස මනස සකස් නොවී එය විරුද්ධ ලිංගික මනසක් ලෙස සකස් වනවා ය යන්නයි.

සංක්‍රාන්ති සමාජභාවී යන පොදු වචනය යටතේ වන පුද්ගලයන් සංක්‍රාන්ති සමාජභාවී යන්න ද ඇතුළුව, පුළුල් විවිධත්වයක් සහිත වචන එකකින් හෝ ඊට වැඩි ගණනකින් තමන්ව හැඳින්වීමට විස්තර කිරීමට ඉඩ ඇත. ඒවායින් සමහරක් පහත විස්තර කර ඇත. එක් එක් පුද්ගලයන් කැමැති විස්තරාත්මක වචන භාවිතා කරන්න. බොහෝ සංක්‍රාන්ති පුද්ගලයන් තමන්ගේ ශරීර වෙනස් කර ගැනීමට වෛද්‍යවරු ලවා හෝමෝන නිර්දේශ කරවා ගනිති. සමහරෙක් ශල්‍යකර්ම පවා සිදු කර ගනිති. නමුත් සියලුම සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයන්ට මේ පියවර ගැනීමේ හැකියාවක් නැති අතර, අනාගතයේ එසේ නොකරන්නටත් ඉඩ ඇත. සංක්‍රාන්ති සමාජභාවී අනන්‍යතාවය වෛද්‍යමය ක්‍රමවේද මත රඳා පවතින්නක් නොවේ.

**සංක්‍රාන්ති ලිංගික (Transsexual)**

වෛද්‍ය සහ මනෝ විද්‍යාත්මක ප්‍රජාවන්ගෙන් සම්භවය වූ ඉතා පැරණි වචනයක් වන අතර, තවමත් තමන්ගේ සිරුර වෛද්‍යමය මැදිහත්වීම් (හෝමෝන සහ/හෝ සැත්කම් අඩංගු වෙන නමුත් ඒවාට සීමා නොවේ.) තුළින් ස්ථිර වශයෙන් තම ශරීරය වෙනස් කළ හෝ වෙනස් කිරීමට බලාපොරොත්තු වන අය හැඳින්වීමට යෙදේ. සංක්‍රාන්ති සමාජභාවී මෙන් නොව සංක්‍රාන්ති ලිංගික යනු පුළුල් පරාසයක් ආවරණය කරන පොදු වචනයක් නොවේ. බොහෝ සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයන් සංක්‍රාන්ති ලිංගික යන වචනයෙන් තමන් හඳුනා ගන්නේ නැති අතර, සංක්‍රාන්ති සමාජභාවී යන වචනය ප්‍රිය කරති. කෙනෙකු කැමැති වන්නේ කුමන වචනය දැයි ඇසීම යෝග්‍යය. එසේ කැමැති නම්, මෙය විශේෂණ පදයක් ලෙස එනම් සංක්‍රාන්ති ලිංගික කාන්තාවක් හෝ සංක්‍රාන්ති ලිංගික පිරිමියෙක් ලෙස භාවිතා කරන්න.

# පාරිභාෂික පදමාලාව

**සංක්‍රාන්ති (Trans)**

සංක්‍රාන්ති සමාජභාවී හෝ සංක්‍රාන්ති ලිංගික යන්න හැඳින්වීමට කෙටි වචනයක් ලෙස හෝ සංක්‍රාන්ති සමාජභාවී යටතේ එන පුළුල් විවිධත්වයකින් යුතු අනන්‍යතා අතරට ඇතුළත් වීමට මෙය භාවිතා වේ. මෙහි තේරුම නිශ්චිත හෝ පුළුල් වශයෙන් තේරුම් නොගැනෙන බැවින්, මෙයින් අදහස් වන්නේ කුමක් දැයි නොදන්නා පාඨකයන් සමඟ මෙය භාවිතයේ දී ප්‍රවේශම් වන්න. මෙය ඍජු ප්‍රකාශයක හෝ ඔබේ කතාවේ සන්දර්භයට මෙහි ඇති තේරුම පැහැදිලිව තේරුම් කළ හැකි අවස්ථාවල දී පමණක් මෙය භාවිතා කරන්න.

**සංක්‍රාන්ති සමාජභාවී පිරිමියා (Transgender man)**

උපතේ දී ලිංගික අවයව වල ස්වරූපය අනුව ගැහැණු යැයි සලකනු ලැබූ නමුත්, තමන්ව පිරිමියකු ලෙස හඳුනාගනිමින් එලෙස ජීවත්වන පුද්ගලයන් මෙම වචනය තමන්ව විස්තර කිරීමට යොදා ගනිති. සමහරවිටක ඔවුන් මෙය සංක්‍රාන්ති පිරිමියා ලෙස කෙටි කරන්නට ද ඉඩ ඇත. එසේම සමහරෙක් F to M (එෆ්-ටු-එම්) එනම් කාන්තා සිට පිරිමි යන්න කෙටි කර භාවිතා කරන අතර, සමහරෙක් සරල වශයෙන් පිරිමි ලෙස කිසිදු වෙනස් කිරීමකින් තොරව භාවිතා කරති. එක් එක් පුද්ගලයා පෞද්ගලිකව කැමැති අනන්‍යතාවය කුමක් දැයි අසා දැන ගැනීම වඩා සුදුසුය.

**සංක්‍රාන්ති සමාජභාවී ගැහැණිය (Transgender woman)**

උපතේ දී ලිංගික අවයවවල ස්වරූපය අනුව පිරිමි යැයි සලකනු ලැබූ නමුත්, තමන්ව ගැහැණියක ලෙස හඳුනාගනිමින් එලෙස ජීවත්වන පුද්ගලයන් මෙම වචනය තමන්ව විස්තර කිරීමට යොදා ගනිති. සමහරවිටක ඔවුන් මෙය සංක්‍රාන්ති ස්ත්‍රිය ලෙස කෙටි කරන්නට ද ඉඩ ඇත. එසේම සමහරෙක් M to F (එම්-ටු-එෆ්) එනම් කාන්තා සිට පිරිමි යන්න කෙටි කර භාවිතා කරන අතර, සමහරෙක් සරල වශයෙන් පිරිමි ලෙස කිසිදු වෙනස් කිරීමකින් තොරව භාවිතා කරති. එක් එක් පුද්ගලයා පෞද්ගලිකව කැමැති අනන්‍යතාවය කුමක් දැයි අසා දැන ගැනීම වඩා සුදුසුය.

**විරුද්ධ ලිංගික ඇඳුම් හඳින්නා/ ක්‍රොස් ඩ්‍රෙසර් (Cross Dresser)**

ඕනෑම කෙනෙකු වෙනස් ලිංගයක් සමග සබැඳි ඇඳුම් ඇඳීමට ඉඩ ඇති අතර, ක්‍රොස් ඩ්‍රෙසර් යන වචනය භාවිතා වන්නේ කලින් කලට කාන්තාවන් හා සංස්කෘතිව සබැඳි ඇඳුම් පැළඳුම්, අංගරචන, සහ ආභරණ පළඳින විෂමලිංගික හෝ සමහරවිට සමරිසි පිරිමින්ටය. මේ ක්‍රියාව ස්ත්‍රී පුරුෂ සමාජභාව ප්‍රකාශනයේ එක් ආකාරයක් වන අතර, විනෝදයට කරන්නක් නොවේ. ක්‍රොස් ඩ්‍රෙසර් කෙනෙකු තමන්ගේ ලිංගය ස්ථිරව වෙනස් කිරීමට හෝ සම්පූර්ණ ජීවිත කාලය කාන්තාවක් ලෙස ගත කිරීමට බලාපොරොත්තු නොවේ.

**එල්ජීබීටීඅයිකිව් (LGBTIQ)**

සමරිසි කාන්තාවන්, සමරිසි පුරුෂයින්, ද්විරිසි කාන්තාවන් හා පුරුෂයින්, සංක්‍රාන්ති සමාජභාවීය පුද්ගලයින්, අන්තර් ලිංගික පුද්ගලයින්, තම ලිංගික හා ස්ත්‍රී පුරුෂ සමාජභාවීය අනන්‍යතාවය කුමක්දැයි නිශ්චිතව හඳුනානොගත් පුද්ගලයින්.

මෙය ඉංග්‍රීසි භාෂාවෙන් Lesbian, Gay, Bisexual, Transgender, Intersex and Questioning යනුවෙන් කියවෙන අනන්‍යතා ගණනාවක ප්‍රජාවක් හැඳින්වීමට යෙදෙන දිගු වචනයක කෙටි ස්වරූපයයි. එල්ජීබීටීඅයිකිව් (LGBTIQ) යන්න භාවිතා වන්නේ බොහෝ දුරට ප්‍රජාවේ විවිධත්වය පිළිගැනෙන බැවිනි. මෙම වචනය භාවිතා කළ යුත්තේ පාඨකයා ව්‍යාකූල නොවන ආකාරයටය. පළමු වරට භාවිතා කරන විට එහි දීර්ඝ අදහස විස්තර කරන්න. එමෙන්ම මෙය සර්වනාම පදයක් ලෙස භාවිතා කරන්නේ පොදුවේ සුළුතර ලිංගික අනන්‍යතා හෝ විවිධ ලිංගික අනන්‍යතා සහිත ප්‍රජාව හැඳින්වීමට හා ඔවුන්ගේ මානව හිමිකම් ආරක්ෂා කිරීමට යොදාගත හැකි බැවිනි.

# පාරිභාෂික පදමාලාව

**ක්වියර් (Queer)**

ඉංග්‍රීසි භාෂාවෙන් සම්ප්‍රදායිකව අපහාසාත්මක වචනයක් වන ක්වියර් (විකාර, වෙනස්) යන වචනය ඇතැම් LGBTIQ ජනතාව විසින් තමන්ව විස්තර කිරීමට යොදා ගන්නා ලදී. කෙසේ නමුත් එය LGBTIQ ප්‍රජාව අතර පවා පොදුවේ පිළිනොගැනෙන බැවින් කෙනෙකු තමන්ව එලෙස හඳුනා ගන්නේ නම් හෝ ඍජු ප්‍රකාශයක සඳහන්ව ඇත්නම් පමණක් මෙය භාවිතා කරන්න. 'LGBT' යන්නෙහි කෙළවර Q සඳහන්ව ඇත්නම්, එයින් අදහස් වන්නේ ක්වියර් (Queer) සහ/හෝ තම ලිංගික හා ස්ත්‍රී පුරුෂ සමාජභාවීය අනන්‍යතාවය කුමක්දැයි නිශ්චිතව හඳුනානොගත් පුද්ගලයින් (Questioning) ය.

**ස්ථිතික සමාජභාවී/සිස් සමාජභාවී (සිස්ජෙන්ඩර්/Cisgender)**

ඇතැමෙක් විසින් සංක්‍රාන්ති නොවන ස්ත්‍රී පුරුෂ සමාජභාවයන් ඇති පුද්ගලයන් විස්තර කිරීමට යොදා ගන්නා පදයකි. 'සිස්' යන ලතින් උපසර්ගයෙන් අදහස් වන්නේ 'එයට සමාන පැත්තේම' වන අතර එබැවින් එය "සංක්‍රාන්ති" යන්නට විරුද්ධ පදයක් වේ. පොදුවේ හැමටම තේරුම් යන පරිදි සංක්‍රාන්ති නොවන පුද්ගලයන් හැඳින්වීමට සරලව සංක්‍රාන්ති නොවන පුද්ගලයන් යැයි පැවසීම සෑහේ.

**ස්ත්‍රී පුරුෂ සමාජභාවය කුමක්දැයි තහවුරු නොකරන ලද (Gender Non-Conforming)**

තමන්ගේ ස්ත්‍රී පුරුෂ සමාජභාව ප්‍රකාශනය ගැහැණුකමේ සහ පිරිමිකමේ සම්ප්‍රදායික අපේක්ෂාවන්ගෙන් වෙනස් වන පුද්ගලයන් හැඳින්වීමට යෙදේ. සියලූම ස්ත්‍රීපුරුෂ සමාජභාවීය අනන්‍යතාවන් තහවුරු නොකරන ලද පුද්ගලයන් තමන් සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයන් ලෙසම පමණක් හඳුනා නොගන්නා බවත්, සියලූම සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයන් ස්ත්‍රී පුරුෂ සමාජභාව තහවුරු නොකරන ලද යන කොටසට අයිති නොවන බවත් සලකන්න. සම්ප්‍රදායික නොවන ස්ත්‍රී පුරුෂ සමාජභාවීය ප්‍රකාශනයන් බොහෝ දෙනෙකුට ඇති අතර, එම කාරණය නිසා පමණක් ඒ අය සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයන් බවට පත් නොවේ. බොහෝ සංක්‍රාන්ති සමාජභාවී පිරිමින්ට සහ ගැහැණුන්ට සම්ප්‍රදායිකව ගැහැණුකමට සහ පිරිමිකමට අයත් වන ස්ත්‍රී පුරුෂ සමාජභාව ප්‍රකාශනයන් ඇත. සරලව සංක්‍රාන්ති සමාජභාවී වීම කෙනෙකු ස්ත්‍රී පුරුෂ සමාජභාව අවිනිශ්චිත තත්වයට පත් නොකරයි. මෙය සංක්‍රාන්ති සමාජභාවී හෝ සංක්‍රාන්ති ලිංගික යන්නට සමාන පදයක් නොවන අතර කෙනෙකු තමන් ස්ත්‍රී පුරුෂ සමාජභාව අවිනිශ්චිත යනුවෙන් හඳුනා ගන්නේ නම් පමණක් මෙය භාවිතා කළ යුතුය.

**ක්වියර සමාජභාවී (Genderqueer)**

තමන්ගේ ස්ත්‍රී පුරුෂ සමාජභාව අනන්‍යතාවය සහ/හෝ ස්ත්‍රී පුරුෂ සමාජභාව ප්‍රකාශනය පිරිමියා සහ ගැහැණිය යන කාණ්ඩවලින් පිටතට වැටෙන පුද්ගලයන් හැඳින්වීමට යෙදෙන වචනයකි. ඔවුන් තමන්ගේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිරිමියා සහ ගැහැණිය අතර යම් තැනකට වැටෙන ලෙස හෝ එම වචනවලින් තමන් සම්පූර්ණයෙන්ම වෙනස් වන ලෙස හෝ තමන්ව නිර්වචනය කිරීමට ඉඩ ඇත. මෙම වචනය සංක්‍රාන්ති සමාජභාවී හෝ සංක්‍රාන්ති ලිංගික වචනයන්ට සමාන පදයක් නොවන අතර මෙය භාවිතා කළ යුත්තේ කෙනෙක් එලෙස තමන්ව ස්වයං හඳුනා ගැනීමකට ලක් කරන්නේ නම් පමණි. එය සමහරවිට පොදුවේ පවතින සම්මතයන්ට විරුද්ධ වෙන හෝ ඒවාට එරෙහිව නැගී සිටින දේශපාලනික කරුණක් ද විය හැකිය.

**සමලිංගික භීතිකාව (Homophobia)**

සමරිසි පුද්ගලයන් කෙරේ ඇති භීතිය, නොඉවසීම හෝ අගතිගාමීත්වය යන වචන LGBT පුද්ගලයන්ට එරෙහි තදබල අකැමැත්ත බොහෝ දුරට විස්තර කරයි.

**ද්විරිසි භීතිකාව (Biphobia)**

ද්විරිසි පුද්ගලයන් වෙත ඇති බිය, බෙහෝවිට පරදාර සේවනය, බහුපුද්ගල ලිංගික ඇසුර, ලිංගිකව පැතිරෙන රෝග ආදිය වැරැදි සහගත ලෙස සම්බන්ධ කර ගත් ඒකාකෘතීන් මත පදනම්ව ඇත. නොඉවසීම හෝ අගතිගාමීත්වය යන වචන ද්විරිසි පුද්ගලයන්ට එරෙහි තදබල අකැමැත්ත බොහෝ දුරට විස්තර කරයි.

# පාරිභාෂික පදමාලාව

### පිටතට පැමිණීම (Coming Out)

ජීවිත කාලය පුරා පවතින තමාවම පිළිගැනීමේ ක්‍රියාදාමයයි. තමාව සමරිසි ගැහැණියක්, සමරිසි පුරුෂයෙක් හෝ සංක්‍රාන්ති සමාජභාවීය පුද්ගලයෙක් ලෙස අනන්‍යතාවයක් පළමුව තමා තුළ නිර්මාණය කර ගන්නා අතර, පසුව අනුන්ට එළිදරව් කරති. ප්‍රසිද්ධියේ තමන්ගේ අනන්‍යතාවය බෙදා හදා ගැනීමේ පිටතට පැමිණීමේ කොටසක් වීමට හෝ නොවීමට පුළුවන.

### පිටතට පැමිණි පුද්ගලයා (Out)

තමන්ගේ අනන්‍යතාවය පෞද්ගලිකව, ප්‍රසිද්ධියේ සහ/හෝ තමන්ගේ වෘත්තීය ජීවිතයේ දී ප්‍රකාශ කරන පුද්ගලයා. උදා - රිකී මාටින් යනු පිටතට පැමිණි පොප් තරුවකි. විවෘතව සමරිසි යන්න වඩා සුදුසුයි.

### විවෘතව සමරිසි (Openly Gay)

තමන් සමරිසි ලෙස පෞද්ගලිකව, ප්‍රසිද්ධියේ සහ/හෝ වෘත්තීය ජීවිතයේ දී ස්වයං-හඳුනාගැනීමක් සිදු කරන අය විස්තර වේ. එසේම විවෘතව සමරිසි ගැහැණියක්, විවෘතව සමරිසි පුරුෂයෙක් හෝ විවෘතව සංක්‍රාන්ති සමාජභාවීය පුද්ගලයෙක් යනුවෙන් ද භාවිතා කළ හැකිය. නිවැරැදි පදයක් වන මෙය, පොදුවේ බහුලව භාවිතා වෙන නමුත්, මෙම වචනයෙන් ප්‍රසිද්ධියේ තම ලිංගික දිශානතිය හෝ ස්ත්‍රී පුරුෂ සමාජභාවීය අනන්‍යතාවය කියා සිටීමේ පාපොච්චාරණ පැතිකඩයක් ද තිබේ. ඉහත ඇති පිටතට පැමිණි පුද්ගලයා යන්න බලන්න.

### සැඟවුණු (Closeted)

තමන්ගේ ලිංගික දිශානතිය හෝ ස්ත්‍රී පුරුෂ සමාජභාවිය අනන්‍යතාවය සම්බන්ධයෙන් විවෘත නැති පුද්ගලයෙක් විස්තර කරයි. තමන්ගේ සමරිසි ගැහැණියක්, සමරිසි පුරුෂයෙක් හෝ සංක්‍රාන්ති සමාජභාවීය පුද්ගලයෙක් යන අනන්‍යතාවය සම්බන්ධයෙන් පිටතට නොපැමිණි පුද්ගලයකු ලෙස සරලව හැඳින්වීම වඩා සුදුසුයි.

### අනන්‍යතාවය පිටතට හෙළිදරව් කිරීම (Outing)

අදාළ පුද්ගලයාගේ කැමැත්තකින් තොරව තවත් කෙනෙකු විසින් අදාළ පුද්ගලයාගේ ලිංගික දිශානතිය හෝ ස්ත්‍රී පුරුෂ සමාජභාවීය අනන්‍යතාවය ප්‍රසිද්ධියේ එළිදරව් කිරීමයි (සමහර විට කටකතාවක් හෝ අනුමානයක් පදනම් කර ගෙන). LGBT ප්‍රජාවේ බොහෝ දෙනෙක් මෙය නොසුදුසු ක්‍රියාවක් සේ සලකනු ලබයි.

### ජීවන රටාව (Lifestyle)

සමරිසි ගැහැණියක්, සමරිසි පුරුෂයෙක්, ද්විරිසි පුද්ගලයෙක් හෝ සංක්‍රාන්ති සමාජභාවීය පුද්ගලයෙක්ගේ ජීවිත අපකීර්තියට ලක් කිරීම සඳහා සමරිසි-විරෝධී අන්තවාදීන් විසින් භාවිතා කරනු ලබන වැරැදි වචනයකි. විෂමලිංගික ජීවන රටාවක් කියා එකක් නැත්තා සේම, ලෙස්බියන්, ගේ, ට්‍රාන්ස් යනුවෙන් ජීවන රටාවක් ද නැත.

### විවාහය (Marriage)

විවාහය යනුවෙන් සාමාන්‍යයෙන් අදහස් කරන්නේ පවුලක් ගොඩනැගීම සඳහා නීත්‍යනුකූලව සිදුකරන ක්‍රියාකාරකමක් වන අතර රාජ්‍ය අනුග්‍රහය, වෙනත් සේවාවන් ලබාගැනීම සඳහා ප්‍රවේශය යනාදිය හිමිවන ගිවිසුමකි. සමරිසි විවාහ සම්බන්ධයෙන් සලකා බලන කල එකම ලිංගයට අයිති යුවලකට ශ්‍රී ලංකාවේ හෝ වෙනත් දකුණු ආසියානු රටවල විවාහ විය නොහැකිය. 2017 වසර වන විට ලෝකයේ රටවල් 20 ක පමණ එකම ලිංගයට අයත් අයට විවාහ විය හැකිය.

# පාරිභාෂික පදමාලාව

**සිවිල් එකමුතුව (Civil Union)**

විවාහයකට පත්වෙන අයට ලැබෙන බොහෝ අයිතිවාසිකම් (ඇතැම් අයිතිවාසිකම් නොලැබේ), වගකීම්, ආරක්ෂාව සහිත රාජ්‍යය විසින් පිළිගත් සමරිසි පුරුෂයින් හෝ සමරිසි කාන්තාවන් යුවළගේ සම්බන්ධතාවයක්.

**ගෘහස්ත සබඳතාවය/හවුල (Domestic Partnership)**

දෙදෙනෙකු අතර පවතින කැපවුණු සම්බන්ධතාවයකට ලැබෙන සිවිල්/නීතිමය හඳුනා ගැනීම. ඇතැම් විට මෙයින් ඔවුනට සීමාසහිත ආරක්ෂාවක් ලැබේ.

**සොඩොමි නීති (**Sodomy Laws**)**

ඉතිහාසයේදී මෙම නීති සමරිසි පුද්ගලයන් තෝරා අත්අඩංගුවට ගැනීමට භාවිතා විය. “සොඩොමි” යන වචනය සමරිසි, ද්විරිසි හෝ ලිංගිකත්වය විස්තර කිරීමට කිසි දිනක භාවිතා නොකළ යුතුය.

මුල දී දණ්ඩ නීති සංග්‍රහයේ 365 වගන්තිය ලෙස ඉදිරිපත් වූ, වත්මන් 365 අ වගන්තිය විසින් ශ්‍රී ලංකාවේ සමරිසි පුරුෂයින් හා කාන්තාවන් අතර සිදුකරන සමාන ලිංගික ක්‍රියාකාරකම් අපරාධකරණය කරනු ලබයි.

# හැඳින්වීම

ශ්‍රී ලංකාව බහු වාර්ගික, බහු ආගමික හා විවිධ සංස්කෘතික අනන්‍යතාවන්ගෙන් යුත් සමාජ ක්‍රමයක් පවතින රටකි. ශ්‍රී ලංකාවේ මිනිසුන්ගේ සිවිල් හා දේශපාලනමය තත්ත්වයන් වලට ඔවුන් විසින් මෙහෙයවනු ලබන සමාජ ධර්මතා, ආකල්ප යනාදිය බලපෑම් කෙරේ. බොහෝවිට මෙම සමාජ ධර්මතා, ආකල්ප, අගයයන්, ප්‍රතිමාන යනාදිය සකස් වී තිබෙන්නේ එක් පිරිසකට සමාජයේ ප්‍රමුඛත්වයත්, තවත් පිරිසකට ද්විතීයිකත්වයක් ලැබෙන ආකාරයටය. මෙහිදී ප්‍රමුඛත්වය හිමිවන පිරිස නිතැතින්ම බහුතරය වන අතර ද්විතියිකත්වයට පත්වන පිරිස සුළුතරය බවට පත්වේ. එමගින් සිදුවන්නේ බහුතරය විසින් පිළිගන්නා හෝ අදහන සමාජ ක්‍රමය හෝ සමාජ සම්මතයන් පොදු සමාජය විසින් පිළිගන්නා සම්මතය බවට පත්වීමයි. වාර්ගික වශයෙන්, ආගමික වශයෙන් හෝ විවිධ සංස්කෘතික විෂයයන් වශයෙන් පමණක් නොව මිනිසුන්ගේ ලිංගිකත්වය මතද වෙනස්කම් නිර්මාණය වී ඇත. ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන්ම පැවසෙන පරිදි ශ්‍රී ලාංකේය ජනතාව, කුලය, ජනවර්ගය, දේශපාලන පක්ෂය, ආගම හා ස්ත්‍රී පුරුෂ වශයෙන් විවිධ අනන්‍යතා දරන අතර මෙම වෙනස් අනන්‍යතාවන්ට වෙනස් ආකාරයේ වටිනාකම් හිමිවේ.

වෙනස් අනන්‍යතාවන් සහිත ජන කණ්ඩායම් පිළිබඳ සාකච්ඡා කිරීමේදී ලිංගික වශයෙන් වෙනස් කණ්ඩායම්, ලිංගික කැමැත්ත අනුව වෙනස් කණ්ඩායම් හා ස්ත්‍රී පුරුෂ සමාජභාවීය වශයෙන් වෙනස් කණ්ඩායම් යනාදී වශයෙන් පොදුවේ ලිංගිකත්වය යන තේමාව යටතේ සලකා බැලෙන ජන කණ්ඩායම් වේ. ඔවුන් සම්බන්ධව සමාජයේ වෙනස් ආමන්ත්‍රණ හා නම් පටබැඳීම් පවතින අතර, මානව හිමිකම් මූලාශ්‍ර යටතේ ඔවුන්ව වර්ගීකරණය කරන්නේ LGBTIQ (Lesbian, Gay, Bisexual, Transgender, Intersex and Questioning) ප්‍රජාව යනුවෙනි. සිංහල භාෂාවෙන් ඔවුන් සමරිසි කාන්තාවන්, සමරිසි පුරුෂයින්, ද්විරිසි කාන්තාවන් හා පුරුෂයින්, සංක්‍රාන්ති සමාජභාවීය පුද්ගලයින්, අන්තර් ලිංගික පුද්ගලයින් හා තම ලිංගික හා ස්ත්‍රී පුරුෂ සමාජභාවීය අනන්‍යතාවය කුමක්දැයි නිශ්චිතව හඳුනානොගත් පුද්ගලයින් යනුවෙන් අදහස් කෙරේ.

මෙහිදී සමරිසි කාන්තාවන්, සමරිසි පුරුෂයින් හා ද්විරිසි කාන්තාවන් හා ද්විරිසි පුරුෂයින් යන අය ඔවුන්ගේ ලිංගික දිශානතිය අනුව වර්ගීකරණය කරන අතර සංක්‍රාන්ති සමාජභාවීය හා අන්තර් ලිංගික යන කොටස් වර්ගීකරණය කරන්නේ ඔවුන්ගේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය අනුවයි. ලිංගික දිශානතිය හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය යනු කුමක්දැයි ඉදිරි පරිච්ඡේදයේදී සාකච්ඡා කෙරේ. ඉහත කී ප්‍රජාව ශ්‍රී ලංකාව ඇතුළත විවිධාකාරයේ හිංසනවලට, නොසලකා හැරීම්වලට හා වෙනස්කොට සැලකීම්වලට භාජනය වන අතර ඒ නිසා ඔවුන්ගේ ජීවිත නිරන්තරයෙන් අවිශ්වාසයෙන්, සැකයෙන්, බියෙන් හා තම අනාගතය පිළිබඳ බිඳුනු බලාපොරොත්තුවලින් සමන්විත වේ. එමෙන්ම පවුලෙන්, මිත්‍ර කණ්ඩායම් අතරින්, අධ්‍යාපනය ලබන ස්ථානවලින්, සෞඛ්‍ය සේවා සපයන ආයතන වලින්, රජයේ හා පෞද්ගලික සේවා සපයන ආයතනවලින්, පොලීසිය ඇතුළු නීතිය බලාත්මක කරන ආයතනවලින්, ආගමික ස්ථානවලින් හා ආගමික භාවිතාවන්ගෙන්, ජනමාධ්‍යයෙන්, රැකියා කරන ස්ථානවලින් යනාදී ලෙස විවිධ ස්ථානවලදී ඔවුන්ව වෙනස්කොට සැලකීමට, අපහාසාත්මක ලෙස සැලකීමට, උසුළු විසුළු කිරීම හා සමච්චලයට ලක්කිරීමට පමණක් නොව ශාරීරික හා මානසික වශයෙන් හිංසනයට ලක්කිරීමද සිදුවේ. මෙහි ප්‍රතිඵලයක් ලෙස විවිධ ලිංගික අනන්‍යතා සහිත ප්‍රජාවගෙන් විශාල ප්‍රතිශතයක් මානසික රෝගවලින් හා විභීනතාවලින් පීඩා විඳී. බොහෝ දෙනා ආතතිය, කාංසාව, විෂාදය, භින්නෝන්මාදය වැනි විවිධ මානසික අබාධවලින් පෙළෙන අතර ඒ නිසා ඔවුන්ගේ ජීවිත හා පෞරුෂ සංවර්ධනයට බාධා පැමිණේ.

සමාජයීය වශයෙන් සිදුවන විවිධ හිංසන හා වෙනස්කොට සැලකීම් තව තවත් බලසම්පන්න කරන්නේ ශ්‍රී ලංකාවේ පවතින නීතිය මගිනි. බොහෝ යටත්විජිත රටවල්වල මෙන්ම ශ්‍රී ලංකාවේ ද වර්තමානයේ පවතින නීතිය බ්‍රිතාන්‍ය වික්ටෝරියානු සදාචාරය මත පදනම් වූවකි. මෙහිදී ලිංගික කැමැත්ත හා දිශානතිය මත පදනම්ව විවිධ ලිංගික අනන්‍යතා සහිත ප්‍රජාවට එරෙහිව නීතිය ක්‍රියාත්මක වන අතර සමාන ලිංගිකයෙකුට කැමැත්තක් ඇතිවීම හා සමාන ලිංගිකයෙකු සමග සම්බන්ධතා පැවැත්වීම නීතියට අනුව අපරාධයක් ද වේ. දිගුකාලයක් තිස්සේ පැවති කාන්තාවට එරෙහි හිසංන වැළැක්වීම සඳහා එතෙක් පැවති නීති හා රෙගුලාසි වෙනස්වී කාන්තාවට ප්‍රගතිශීලි වෙනස්කම් ඇතිකරමින් ඔවුන්ගේ අයිතිවාසිකම් හා ආරක්ෂාව තහවුරු කළ ද තවමත් 1883 සිට පවතින සමරිසි ප්‍රජාව ඇතුළු විවිධ ලිංගික අනන්‍යතා සහිත ප්‍රජාවට එරෙහිව පවතින නිතිය තව තවත් බලසම්පන්න වෙමින් පවතී. මේ නිසා විවිධ ලිංගික අනන්‍යතා සහිත ප්‍රජාව නිරන්තරයෙන් පොලීසියේ අවධානයට ලක්වන අතර පවතින නීතිමය වගන්තිවල ඇති අර්ථ සම්පන්න නොවූ තත්ත්වය නිසා ඒවායේ වාසියද ලබාගනිමින් පොලීසිය විසින් විවිධ ලිංගික අනන්‍යතා සහිත ප්‍රජාවට එරෙහිව තම බලය ප්‍රදර්ශනය කරමින් සිටී.

මේ අනුව එක් පසෙකින් සමාජය මගින් ඇතිකරවන වෙනස්කොට සැලකීමත්, අනෙක් පසින් නීතිය මගින් අපරාධකරුවන් ලෙස සැලකීමත් මගින් සිදුවන්නේ විවිධ ලිංගික අනන්‍යතා සහිත ප්‍රජාව සමාජයේ කොන්වන පිරිසක් බවට පත්වීමයි. මෙහි භයානකම ප්‍රතිඵලය වන්නේ ශ්‍රී ලංකාවේ සංවර්ධනයට දායක විය හැකි හා සංවර්ධන ක්‍රියාකාරකම් සඳහා ඵලදායීව යොදාගත හැකි විවිධ හැකියාවන්ගෙන් යුක්ත ශ්‍රම බලකායෙන් කොටසක් තම රට තුළ ස්වයං අභිමානයෙන් යුතුව ජීවත්විමට නිදහසක් නොමැති නිසා රැකියා සඳහා හෝ අධ්‍යාපනය සඳහා හෝ එසේත් නැතිනම් සරණාගතයින් ලෙස වෙනත් රටවල්වලට සංක්‍රමණය වීමයි. මෙම තත්ත්වය වෙනස් කිරීම වෙනුවෙන් මැදිහත් විය හැකි සම්පත්දායකයින් අතර ප්‍රධාන ස්ථානයක් මාධ්‍යවේදීයා දරන බව අපගේ විශ්වාසයයි. විවිධ ලිංගික අනන්‍යතා සහිත ප්‍රජාව වෙනුවෙන් මාධ්‍ය දායකත්වය ආකාර දෙකකින් සිදුකළ හැකි බව අප හඳුනාගනී. පළමුවැන්න විවිධ ලිංගික අනන්‍යතා සහිත ප්‍රජාව සම්බන්ධ සිද්ධි, ප්‍රවෘත්ති ආදිය වාර්තා කිරීමේදී ඔවුන්ගේ මානව හිමිකම් හා ආත්මගරුත්වය රැකෙන පරිදි වාර්තාකරණයේ යෙදීමයි. එය නිවැරදි වාර්තාකරණය, සංවේදී වාර්තාකරණය හා ආචාරධර්මීය වාර්තාකරණය යන මාධ්‍ය භාවිතාවන්හි ත්‍රිවැදෑරුම් ප්‍රතිපත්ති ආරක්ෂා කිරීමකි. දෙවනුව විවිධ ලිංගික අනන්‍යතා සහිත ප්‍රජාව සම්බන්ධයෙන් සහකම්පනය ඇතිවන ආකාරයෙන් හා සමාජයට පණිවිඩයක් ලබාදෙන ආකාරයෙන් නිර්මාණශීලීත්වයෙන් යුතුව වාර්තා කිරීමයි. සමාජය ප්‍රතිශෝධනය කිරීමේ ක්‍රියාවලියේදී දේශපාලනඥයා හා සමාජ විද්‍යාඥයාටත් වඩා ඉහළ ස්ථානයක මාධ්‍ය භූමිකාව ස්ථානගත වන බැවින් නිවැරදි හා සංවේදී රචනය හා වාර්තාකරණය මගින් විවිධ ලිංගික අනන්‍යතා සහිත ප්‍රජාව වෙනුවෙන් විශාල කාර්යභාරයක් සිදුකිරීමට මාධ්‍යවේදියාට හැකිය. ඒ සඳහා අවශ්‍ය මාර්ගෝපදේශන සපයන මෙම පොත් පිංච ඔබට අවශ්‍ය සංවේදීකරණය හා දැනුම ලබාදෙනු ඇතැයි අපි විශ්වාස කරමු.

මෙම පොත් පිංච EQUAL GROUND ආයතනය විසින් ඔබ වෙත පිරිනමන්නේ අප විසින් 2004 වර්ෂයේ සිට විවිධ ලිංගික අනන්‍යතා සහිත ප්‍රජාව වෙනුවෙන් වැඩකිරීමෙන් ලබාගත් අත්දැකීම් හා දැනුම් සම්භාරය මත පදනම්වය. සියලූම දෙනාට මානව හිමිකම් අවශ්‍ය වන බවත්, සියලූම දෙනා හිරිහැරයකින් තොරව නිදහසේ තම ජීවිතය ගත කිරීමට ආශාවෙන් හා අපේක්ෂාවෙන් සිටින බවත් අප විශ්වාස කරන අතර එලෙස අපේක්ෂාවන් දල්වා සිටින්නවුන් අතර විවිධ ලිංගික අනන්‍යතා සහිත ප්‍රජාව ඉදිරියෙන්ම සිටින බව විශ්වාස කරමින් එම අපේක්ෂාවන් මුදුන් පත් කිරීම වෙනුවෙන් ඔබගේ ලේඛන හා වාර්තාකරණ හැකියාව යොදාගනු ඇතැයි අපි බලාපොරොත්තු වෙමු.

# ලිංගික දිශානතිය හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය හැඳින්වීම

පුරුෂයෙකුගේ හා ගැහැණියකගේ ලිංගික එක්වීමකින් පසුව පුරුෂයාගේ ශුක්‍රාණුත්, ගැහැණිය විසින් නිකුත් කරනු ලබන ඩිම්බත් සංසේචනය වී දරුවෙකු හෙවත් තවත් මනුෂ්‍ය ජීවියෙකු උපදින බව සියලූ දෙනාම දන්නා සත්‍යයකි. ක්‍රෝමසෝම නම් ජාන විශේෂයක් මගින් මෙම ජීව විද්‍යාත්මක දරුවා ගැහැණු දරුවෙක් හෝ පිරිමි දරුවෙකු බවට පත් කරන අතර ඒ අනුව දරුවාගේ ලිංගිකත්වය ස්ත්‍රී ලිංග (XX ආකාරයේ ක්‍රෝමසෝම) හෝ පුරුෂ ලිංග (XY ආකාරයේ ක්‍රෝමසෝම) බවට පත්වේ. මෙය සම්පූර්ණයෙන්ම ජීව විද්‍යාත්මක සංසිද්ධියක් වන අතර දරුවාගේ මවට හෝ පියාට තීරණය කළ හැකි දෙයක් නොවේ. ඒ අනුව පුරුෂත්වය (Masculine) හා ස්ත්‍රීත්වය (Feminine) යනු ජීව විද්‍යාත්මක වශයෙන් විභේදනයකට ලක්වී ඇති නිර්මාණයකි. කාන්තාවක හා පුරුෂයෙකු වෙන්කර හඳුනාගැනෙන්නේ බාහිර හා අභ්‍යන්තර ප්‍රජනන ඉන්ද්‍රියයන්, ලිංග ශෛල, ද්විතීයික ලිංගික චර්යාවන් වැනි සුවිශේෂී වශයෙන් මනුෂ්‍ය වර්ගයා බිහිකිරීමේ හෙවත් ප්‍රජනනය (Reproduction) කිරීමේ හැකියාව අනුවයි. පහත රූප සටහන බලන්න.



මෙම රූප සටහනට අනුව පුද්ගලයෙකුගේ ජීවිතයට අදාළ වන ප්‍රධාන ඉන්ද්‍රියයන් තුනක් පවතී. එනම් මොළය, හදවත හා ලිංගික අවයවයි. මොළය මිනිසාගේ මානසික ක්‍රියාවලිය, චිත්තවේග හා හෝමෝන නිපදවීම හා සම්බන්ධ වන අතර, හදවත රුධිරය සංසරණය කිරීම හා ආදරය, සෙනෙහස වැනි භාවමය දේවල් හා සම්බන්ධ වේ. ලිංගික අවයව මගින් ලිංගික ක්‍රියාකාරකම් හා ප්‍රජනන ක්‍රියාකාරකම් වලට අවශ්‍ය සහාය ලබාදෙයි. පුද්ගලයෙකුගේ ලිංගිකත්වය සම්බන්ධයෙන් සමාජය විසින් සොයා බලන්නේ ලිංගික අවයව පමණි. ලිංගිකත්වයට හා ලිංගික දිශානතිය තීරණය වීමට මොළයේ හා හදවතේ බලපෑම පිළිබඳ අවධානය යොමු කරන්නේ නැත. ජීව විද්‍යාත්මකව උපත ලද දරුවාට නමක්, වාසගමක්, ආගමක්, ජාතියක් හා කුලයක් උපතින් පසුව හිමිවන්නේ සමාජ සංස්කෘතික සාධක මත පදනම් වෙමින්ය. දරුවෙක් උපත ලද සැනින් ජීව විද්‍යාත්මකව ලැබුණු ස්ත්‍රීත්වය හා පුරුෂත්වය සමාජයට අනුව භෞතීස්ම කරන්නේ නිල් පාට ඇඳුම්වලින් පිරිමි දරුවන් හා රෝස පාට ඇඳුම්වලින් ගැහැණු දරුවන් සැරසීමෙනි. ජීව විද්‍යාත්මක ලිංගික බේදය සමාජයට අනුව හැඩගැස්වීම ආරම්භ වන්නේ මෙතැනිනි. ඉන්පසුව පුරුෂයා සහ ස්ත්‍රිය වෙනස් ජීවී කොට්ඨාශ දෙකක් ලෙස සමාජානුයෝජනය කරන අතර සෑම විටම පුරුෂයා මූලික කරගත් සමාජ ධර්මතාවන් හා අගයයන් ප්‍රවර්ධනය කිරීමට උත්සාහ කරයි. මෙලෙස ජීව විද්‍යාත්මක ලිංගිකත්වය සමාජ ආකල්ප, ධර්මතා, ප්‍රතිමාන, සංස්කෘතික විචල්‍යයන් මත පදනම්ව ගැහැණිය හා පුරුෂයාට වෙනස් ආකාරයෙන් සලකනු ලැබීම පිණිස සමාජ ජීව විද්‍යාවක් දක්වා ව්‍යාප්ත කිරීම සිදුකර ඇත.

ජීව විද්‍යාත්මක සාධක මත පදනම්ව සමාජයීය වශයෙන් ගොඩනගා ඇති ආකල්ප හා භාවිතයන් තවදුරටත් ඉදිරියට පවත්වාගෙන යන්නේ සමාජානුයෝජන ක්‍රියාවලිය හරහා බව ඕක්ලේ (1974)[1] විසින් පෙන්වා දී තිබේ.

- කුඩා කාලයේදී දරුවන්ට හුරුකරවන සමාජ චර්යාවන්
- ගැහැණු හා පිරිමි දරුවන් එකිනෙකට වෙනස් අරමුණු කෙරෙහි යොමු කරවීම
- වාචිකව හා ප්‍රායෝගිකව විවිධ තත්ත්වයන් පිරිනැමීම
- එකිනෙකට වෙනස් කටයුතු කෙරෙහි යොමු කරවීම


යන කරුණු මගින් කාන්තාව හා පුරුෂයා පිළිබඳ ගොඩනගන සමාජ ආකල්ප ඉදිරි පරම්පරාව දක්වා ව්‍යාප්ත කරයි.

[1] "The Sociology of Housework. Ann Oakley ," American Journal of Sociology 82, no. 3 (Nov., 1976): 738-740

මෙමගින් ඕක්ලේ පැහැදිලි කිරීමට උත්සාහ දරන්නේ කාන්තාව හා පුරුෂයා වෙත සමාජයීය වශයෙන් හිමිවන භූමිකාවල පදනම ජීව විද්‍යාත්මක වුවද එය ක්‍රියාත්මක වන්නේ සංස්කෘතික චර්යාවන් හරහා බවයි. මෙම සංස්කෘතික චර්යාවන් ස්ත්‍රී පුරුෂ සමාජභාවය (Gender) ලෙස හඳුනාගනී. ස්ත්‍රී පුරුෂ සමාජභාවීය වශයෙන් සමාජය තුළ ගොඩනැගී ඇති අසමානත්වය මගින් සමාජයට පුරුදු කර ඇත්තේ ස්ත්‍රී හා පුරුෂ වශයෙන් පවතින විභේදනය පමණි. මෙම විභේදනය හරහා පුරුෂයා ශක්තිමත්, පුරුෂාර්ථ ධර්මයන් ප්‍රවර්ධනය කරන හා විෂම ලිංගික (ස්ත්‍රීන්ට පමණක් ආකර්ශනය වන) අයෙකු ලෙස දැකීමට කැමති වන අතර කාන්තාව ද්විතීයික ස්ථානයෙහි සිටිය හැකිය. මෙම සාකච්ඡාවට අනුව ජෛවවේදීමය අත්‍යවශ්‍යතාවාදය හා සමාජමය අර්ථ නිරූපණවාදය යනුවෙන් ස්ථර දෙකක් හඳුනාගත හැකි අතර ජෛව වේදය මගින් කාන්තාව හා පුරුෂයා ප්‍රජනන ක්‍රියාකාරකම් මත අර්ථ නිරූපණය කෙරෙන අතර සමාජමය අර්ථ නිරූපණය මගින් ඔවුන් ජීවත්විය යුතු ආකාරය හා බලය බෙදී යා යුතු ආකාරය හැඩගස්වනු ලබයි. විවිධ ලිංගික අනන්‍යතා සහිත ප්‍රජාව ස්ත්‍රී පුරුෂ සමාජභාවීය වශයෙන් වෙනස්කොට සැලකෙන්නේ මේ නිසාය. ජීව විද්‍යාත්මක පුරුෂයා හා ගැහැණිය නියමයක් හා නියතයක් වශයෙන් දැකීම හා ඒ අනුව පවුලේදී, පාසලේදී, රැකියා ස්ථානයේදී, ආගමික ස්ථානයේදී, දේශපාලනික සංවිධානගතවීම් යනාදී විවිධ ස්ථානවලින් බලගැන්වෙන්නේ එය උද්දීපනය වන ආකාරයෙනි. පවත්නා සමාජ සම්මතයට අනුව කාන්තාවක් යනු ලිංගිකත්වය, ප්‍රජනනය හා මාතෘත්වය පරම්පරාවෙන් පරම්පරාවට රැගෙන යන්නිය වේ. එහිදී ජීව විද්‍යාත්මකව කාන්තාවක් වී ඉපදුනාට පසුව එය වෙනස් කළ නොහැකිය. එමෙන්ම ඇයට ප්‍රජනන, මාතෘත්ව හා ලිංගික භූමිකාව ඉටුකිරීමට සිදුවේ. පුරුෂයාටද එසේය. ඔහුද ලිංගිකත්වය, ප්‍රජනනය, පීතෘත්වය හා වාසගම ඇතුළුව පරම්පරාව ඉදිරියට රැගෙන යාමට දායක විය යුතුවේ.

මෙම නියතයන් මගින් සංක්‍රාන්ති සමාජභාවීය පුද්ගලයින් හා සමරිසි පුද්ගලයින් වෙනස්වන්නේ සමාජය විසින් බලාපොරොත්තු වන ස්ත්‍රී පුරුෂ සමාජභාවීය චර්යාවන් ඔවුන්ට ඉටු කිරීමට නොහැකි නිසාය. එපමණක් නොව සමාජය විසින් ගැහැණිය හා පිරිමියාත්, ඔවුන්ගේ සම්බන්ධතාවල ස්වරූපය පිළිබඳවත් නියම කර ඇති තත්ත්වයන් හා කාර්යභාරයන් ඔවුන් විසින් ප්‍රතික්ෂේප කරන නිසාය, එසේත් නැතහොත් ඔවුන්ගේ ක්‍රියාකාරකම් මගින් එකී කාර්යභාරයන් වියුක්ත වන නිසාය. බෝනික්කන් නැළවීම, කුඩා වළං පොඩිවල කෑම ඉවීම, මාල, වළලු, කොණ්ඩ කටු ආදිය පැළඳීම යනාදිය මගින් දියණිවරුන් සමාජානුයෝජනය කෙරෙන්නේ ඉහත කී ලිංගිකත්වය, ප්‍රජනනය හා මාතෘත්වය තහවුරු වන ආකාරයටය. සෙල්ලම් කාර්, බෝල, බැට්, තුවක්කු යනාදියත්, සෙල්ලම් ගෙවල් වලදී පුරුෂයාගේ භූමිකාව රඟ දැක්වීමත් පිරිමි ළමුන් විසින් කරන අතර අනාගතයේදී පිරිමියා විසින් සිදුකළ යුතු කාර්යභාරයන් සම්බන්ධ සමාජානුයෝජන පුහුණුව ඒ ආකාරයෙන් ලබාගනී.

ගැහැණු ළමයෙකු මල්වර වීම, මල්වර නැකැත් හා සම්බන්ධ සාම්ප්‍රදායික යාතුකර්ම වල ඇති පුරුෂ මූලිකභාවය, විවාහ චාරිත්‍ර, කන්‍යාභාවය පරීක්ෂා කිරීම, ගැබ් ගැනීම, වඳභාවය, සාපල්‍යතා යාතුකර්ම යනාදිය මගින් කාන්තාව සම්බන්ධ අත්‍යවශ්‍ය ස්ත්‍රී පුරුෂ සමාජභාවීය අදහස් තහවුරු කරන අතර මෙම අදහස් ප්‍රවර්ධනය කෙරෙන ආකාරයේ සමාජ හා සංස්කෘතික ක්‍රියාකාරකම් පවතින නිසා සමරිසි කාන්තාවන් හා සංක්‍රාන්ති සමාජභාවීය කාන්තාවන් සම්බන්ධ සමාජ ආකල්පය හාත්පසින්ම වෙනස් මුහුණුවරක් ගනී. ඔවුන් සමාජ විරෝධීන්, අසාමාන්‍ය චර්යාවල නිරත වන්නන් හා අපරාධකරුවන් ලෙස සලකනු ලබයි. එහෙත්, ඔවුන්ට එසේ සිදුවීමට බලපාන සමාජ හා මනෝ විද්‍යාත්මක සාධක පිළිබඳව අප තේරුම්ගත යුතුය. විශේෂයෙන් මාධ්‍ය ක්ෂේත්‍රයේ නිරත වන පිරිසක් ලෙස ඔබ මිනිසුන්ගේ ලිංගික දිශානතිය හා ස්ත්‍රී පුරුෂ සමාජභාවීය අනන්‍යතාවය යනු කුමක්ද, විවිධ ලිංගික අනන්‍යතා සහිත වූවන් යනු කවුරුන්ද, යන්න දැනගත යුතුය. පහත රූප සටහන බලන්න.




මෙහි දැක්වෙන රූපසටහනේ සිටින්නේ ඔබ යැයි මොහොතකට සිතන්න. ඉහතින් ලිංගිකත්වය සම්බන්ධ සාකච්ඡාවේදී පැවති රූප සටහන දැන් තරමක් සංකීර්ණ කර ඇත. මෙම රූප සටහනට අනුව පුද්ගලයෙකුගේ ස්ත්‍රී පුරුෂ සමාජභාවීය අනන්‍යතාවය තීරණය කරන්නේ, දැනෙන්නේ මොළයේ ක්‍රියාකාරීත්වය අනුවය. එසේත් නැතහොත් ලිංගිකත්වය සමාජ ප්‍රකාශනයක් ලෙස ඉදිරිපත් කරන්නේ මොළයේ ක්‍රියාකාරීත්වය මගිනි. සෑම මනුෂ්‍යයෙකුගේම ලිංගික අවයව වලට අනුරූප මානසික ක්‍රියාවලියක් සකස් වන්නේ නැත. ඔබ ස්ත්‍රියක හෝ පුරුෂයෙකු ලෙස ඔබව හඳුනාගන්නේ ඔබේ මනසට ඔබ එසේය යනුවෙන් දැනෙන නිසාද? නැතහොත් ඔබේ ලිංගික අවයව පුරුෂ හෝ ස්ත්‍රී අවයව ලෙස සකස් වී

තිබෙන නිසා පමණක්මද යන්න මොහොතක් සිතා බලන්න. උපතින් ලැබුණු ලිංගික අවයව මත තීරණය වන ලිංගිකත්වයට ප්‍රතිවිරුද්ධ ලිංගිකයෙකු ලෙස තමාව දැනෙන, තමාව තේරුම් ගන්නා මිනිසුන් ලෝකයේ සිටී. ඔවුන් සංක්‍රාන්ති සමාජභාවීය ප්‍රජාව ලෙස සලකයි (Transgender).

කිසියම් පුද්ගලයෙකු සංක්‍රාන්ති සමාජභාවීය කෙනෙකු බවට පත්වන්නේ කෙසේද යන්න ලෝකයේ පර්යේෂණ විශාල ප්‍රමාණයක් සිදුවී ඇත. එම පර්යේෂණ මගින් අනාවරණය කරගෙන ඇති පරිදි කිසියම් පුද්ගලයෙකු සංක්‍රාන්ති සමාජභාවීය අයෙකු වීමට බලපෑ හැකි නිශ්චිත ජීව විද්‍යාත්මක හේතුවක් පැවසීමට අපහසුය. එය මොළයේ පිහිටා ඇති හයිපොතැලමස සකස් වෙන ආකාරය අනුව තීරණය වේ යැයි ඇතැම් පර්යේෂකයෝ පවසති. ඔවුන්ට අනුව මොළයේ පිහිටීම හා මානසික සංඥා යනාදියත්, පුද්ගලයෙකුට තමන්ව භාමවය වශයෙන් දැනෙන ආකාරයත් උපතින් ලැබුණු ලිංගික අවයව වලට විරුද්ධ වේ. තවත් පර්යේෂකයින් පිරිසක් ප්‍රකාශ කරන්නේ පුද්ගල පෞරුෂ සංවර්ධනයේ මූලික අවධියේදී ගැහැණුන් හා පිරිමින්ගේ චර්යාවන් නිරීක්ෂණය කිරීම මගින් ඇති කරගන්නා ආශයන් මත තමන්ට උපතින් ලැබුණු ලිංගිකත්වය වෙනුවට මානසිකව විරුද්ධ ලිංගිකයෙකු ලෙස සිතීමට හා හැසිරීමට පටන්ගන්නා බවයි. සංක්‍රාන්ති සමාජභාවයට අදාළ ජීව විද්‍යාත්මක හේතු නිවැරදිම ආකාරයෙන් ප්‍රකාශ කළ නොහැක්කේ ඒවා සියල්ල මිනිසුන්ගේ හැඟීම් සම්බන්ද මානසික කරුණු වන නිසාය.

ඔබ මතක තබා ගත යුත්තේ ලිංගිකත්වය යනු ජීව විද්‍යාත්මක දෙයක් පමණක් නොව එය මනෝ විද්‍යාත්මක ද වන බවයි. එමෙන්ම විවිධ ලිංගික අනන්‍යතා ද පැවතිය හැකි බවයි. ඒ අනුව උපතේදී ලිංගික අවයව අනුව පුරුෂයෙකු මානසිකව කාන්තාවක ලෙස තමාව තේරුම් ගන්නා අතර, ඒ අනුව තම චර්යාවන් හා බාහිර පරිසරය සකස් කරගනී. ඔවුන් සංක්‍රාන්ති සමාජභාවීය ගැහැණුන් (Male to Female Transgender- M to F) ලෙස හඳුන්වන අතර උපතේදී ලිංගික අවයව අනුව ගැහැණු ළමයෙකුව ඉපිද පසුව තමන්ව මානසිකව පුරුෂයෙක ලෙස හඳුනාගන්නා හා ඒ අනුව තමාගේ චර්යාවන් හා බාහිර පරිසරය සකස් කරගන්නා පුද්ගලයන් සංක්‍රාන්ති සමාජභාවීය පුරුෂයන් (Female to Male Transgender - F to M) ලෙස හඳුන්වයි.

මෙම සංක්‍රාන්ති සමාජභාවීය පුද්ගලයින්ට තමාගේ මනසට ගැලපෙන ආකාරයෙන් ශරීරය වෙනස්කරගැනීමේ හැකියාව නූතන වෛද්‍ය විද්‍යාව තුළ පවතින අතර ලිංගික පරිවර්තන සැත්කම් සිදුකරගැනීම මගින් සම්පූර්ණයෙන්ම තමන්ගේ මනසට ගැලපෙන හා මනස ඉල්ලා සිටින ආකාරයේ පුද්ගලයෙකු විය හැකිය. එහෙත් මෙලෙස තම ලිංගික අවයව හා ශරීරය වෙනස් කරගැනීම අත්‍යවශ්‍ය නොවන අතර එසේ සිදු කිරීමට බල කළ ද නොහැකිය. බොහෝ සංක්‍රාන්ති සමාජභාවීය පුද්ගලයින් තමන් උපතින් ලැබූ ලිංගික අවයවවලට අනුකූලව මනස සකස් වී නැතිබව හෙවත් තමාට විරුද්ධ ලිංගිකයෙකු ලෙස හැසිරීමට, ඇඳුම් ඇඳීමට හා සමාජයේ පෙනී සිටීමට අවශ්‍ය බව තේරුම් ගැනීමට කල් වේලා ගනී. එයට හේතුව සංක්‍රාන්ති සමාජභාවය ප්‍රතික්ෂේප කරන ආකාරයේ හා පිළිකුල් කරන ආකාරයේ සමාජ ක්‍රමයක් පවතින නිසාය. මේ නිසා බොහෝ සංක්‍රාන්ති සමාජභාවීය දරුවන් තමන්ගේ ශරීරය හා මනස සමග සිදුවන ප්‍රතිවිරුද්ධ අරගලය සමග පමණක් නොව පවුලෙන් හා සමාජයෙන් සිදුවිය හැකි හා සිදුවන බාහිර අරගල සමඟද ගැටේ. ඔබට මහමගකදී හෝ කිසියම් ස්ථානයකදී සංක්‍රාන්ති සමාජභාවීය පුද්ගලයෙක් හමුවන්නේ නම් එම පුද්ගලයා තම ජීවිත කාලය පුරා තමන් සමග හා සමාජය සමඟ අරගල කර හෙම්බත් වූවෙක් බව සිහි තබාගන්න.

සංක්‍රාන්ති සමාජභාවීය පුද්ගලයින්ගෙන් බහුතරයක් ඔවුන්ගේ නිවෙස්වලින් පන්නා දැමෙන අතර විධිමත් රැකියා ස්ථානවලින්ද ප්‍රතික්ෂේප වේ. මේ නිසා ඔවුන් අවිධිමත් රැකියාවන් වල නිරත වන අතර එමගින් තම ජීවිතය අවදානම් සහගත තත්ත්වයන්ට පත් කරගනී. එමෙන්ම සංක්‍රාන්ති සමාජභාවීය පුද්ගලයින්ගෙන් බහුතරයක් දෙනා තම තමාගෙන් හා සමාජයෙන් හුදෙකලා වන නිසා සමාජයෙන් අවමන් සහගත සැලකීම් ලබන නිසා මෙන්ම තම ආත්ම ගරුත්වය හා ස්වයං විශ්වාසයෙන් පරාජයට පත්වන නිසා විවිධ මානසික ආබාධ හෝ විහීනතා වලින් පීඩා විඳී.

ඔවුන් විෂාදය, ආතතිය, කාංසාව හා ඇතැම්විට නියුරෝසියාව වැනි දරුණු ගණයේ මානසික විහීනතා වලින් පීඩාවට පත්වන අතර, එම විඳවීම් හා සමාජ පීඩනය දරාගත නොහැකි අවස්ථාවලදී සියදිවි නසාගැනීමේ අවස්ථාවලටද උදාහරණ පවතී. සංක්‍රාන්ති සමාජභාවිය පුද්ගලයින්ගෙන් බොහෝ දෙනෙක් ස්ත්‍රී පුරුෂ සමාජභාවීය අනන්‍යතාව තහවුරු කිරීමේ සැත්කම (Gender Confirming Surgery) සිදුකරගැනීමට තරම් පොහොසත් අය නොවන අතර ඔවුන් විවිධ හෝමෝන වර්ග භාවිතා කිරීමෙන් හා පියවුරු ඉවත් කිරීමේ හෝ පියවුරු වර්ධනය කිරීමේ සැත්කම් පමණක් කිරීමෙන් තමන් මානසිකව කැමති ලිංගිකත්වයට අනුව බාහිර පෙනුම සකස් කරගනී. ඉහත කී අනන්‍යතාව තහවුරු කිරීමේ සැත්කම සිදුකිරීමෙන් පසුව ඔවුන් හඳුන්වන්නේ සංක්‍රාන්ති ලිංගිකයින් (Transsexual) ලෙසය.

සංක්‍රාන්ති සමාජභාවීය පුද්ගලයෙකු තම සංක්‍රාන්ති ක්‍රියාවලිය තුළ ප්‍රධාන සංක්‍රාන්ති අවස්ථා තුනක් පසුකිරීමට සිදුවන බව අධ්‍යයන මගින් පෙන්නුම් කරයි. ඒවා නම්,

**සමාජමය සංක්‍රාන්තිය**

තම මනසින් ඉල්ලා සිටින ලිංගිකත්වයට අදාළව ඇඳුම් ඇඳීම, කොණ්ඩා විලාසිතා දැමීම, හැසිරීම් රටාව පවත්වා ගෙන යාම හා එදිනෙදා ජීවිතයේදී සිදුකරන අන්තර් ක්‍රියාවන්ට පහසුවන ලෙස නම හෝ ආමන්ත්‍රණය කරන ආකාරය වෙනස් කරගැනීම.

**නෛතිකමය සංක්‍රාන්තිය**

විධිමත් ආකාරයට පුද්ගලයාගේ නම, ඔහු හෝ ඇය වශයෙන් ආමන්ත්‍රණය කරන ආකාරය, නිල ලියකියවිලි සඳහා අවශ්‍ය ආකාරයට ලිංගිකත්වය හෝ ස්ත්‍රී පුරුෂ සමාජභාවය යනාදිය වෙනස් කරගැනීම.

**වෛද්‍යමය සංක්‍රාන්තිය**

හෝමොන සැත්කම් හා විවිධ ලිංගික අවයව වෙනස්කිරීමේ සැත්කම් යනාදිය මගින් තමන්ට දැනෙන හා තමන්ව හඳුන්වා ගැනීමට කැමති ආකාරයට අනන්‍යතාවය සකස් කරගැනීම.

බොහෝ ආසියාතික රටවල් වල සංක්‍රාන්ති සමාජභාවීය ප්‍රජාවට මෙම අවස්ථා තුනෙන් නීතිමය සංක්‍රාන්තිය අපහසු වී ඇති නමුදු ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසන් සභාව, EQUAL GROUND ආයතනය වැනි සංවිධාන හා මෙම ප්‍රජාවේ සාමාජිකයින්ගේ උත්සාහයෙන් ශ්‍රී ලංකාවේ සංක්‍රාන්ති සමාජභාවීය ප්‍රජාවට විධිමත් පියවර කිහිපයකින් පසුව තම ලියකියවිලි ආදිය තමන්ගේ අනන්‍යතාවට ගැලපෙන ආකාරයට සකස්කර ගත හැකිය.

ඉහත රූප සටහනේ දෙවෙනියට දැක්වෙන ආකාරයට ලිංගික දිශානතිය යනුවෙන් අදහස් කරන්නේ කිසියම් පුද්ගලයෙක් තවත් පුද්ගලයෙක්ට කායික, මානසික හා ආධ්‍යාත්මික වශයෙන් සිදුවන ආකර්ශනයයි. ලිංගික දිශානතිය යනු හුදෙක් කායිකව සිදුවන ආකර්ශනයක් ලෙස සමාජය විසින් වැරදි ලෙස හඳුනාගෙන තිබේ.

ලිංගික දිශානතිය යන්න විස්තර කිරීමේදී සමහර අධ්‍යයන[2] මගින් එය ප්‍රධාන කොටස් තුනකට අනුව විස්තර කිරීමට උත්සාහ දරයි.

- ආකර්ශනය වන්නේ කාහටද? (ලිංගික ආකර්ශනය)
- ලිංගිකව ක්‍රියාකාරී වන්නේ කා සමගද? (ලිංගික චර්යාව)
- පුද්ගලයා තමන්ගේ ලිංගික දිශානතිය තේරුම් ගන්නා ආකාරය (ලිංගික අනන්‍යතාව)

මේ අනුව යම් පුද්ගලයෙක් ආත්මීය වශයෙන් තමන්ගේ විරුද්ධ ලිංගික පාර්ශ්වයට ආකර්ශනය වන්නේ නම් එය විෂම ලිංගික දිශානතිය (Heterosexual) ලෙසද, කිසියම් පුද්ගලයෙක් ආත්මීය වශයෙන් තමන් හා සමාන ලිංගිකයෙකුට ආකර්ශනය වන්නේ නම් එය සමරිසි (සාම්ප්‍රදායිකව සමලිංගික ලෙස හඳුන්වයි) ලිංගික දිශානතිය (Homosexual) ලෙසද, කිසියම් පුද්ගලයෙක් ගැහැණු හා පිරිමි යන දෙපාර්ශ්වයටම ආකර්ශනය වන්නේ නම් ඔවුන් ද්විරිසි (Bisexual) ලෙසද හඳුනාගත හැකිය. සමරිසි ලිංගික දිශානතිය නැවත වතාවක් කොටස් දෙකකට බෙදෙන අතර පුරුෂයෙක් විසින් පුරුෂයෙකුට කායිකව, මානසිකව හා ආධ්‍යාත්මිකව සිදුවන ආකර්ශනය සමරිසි පුරුෂ (Gay) ලෙසත් කාන්තාවක් විසින් තවත් කාන්තාවකට කායිකව, මානසිකව හා ආධ්‍යාත්මිකව සිදුවන ආකර්ශනය සමරිසි කාන්තාවන් (Lesbian) ලෙසත් හඳුන්වයි. සාම්ප්‍රදායිකව සමරිසිභාවය 'සමලිංගිකත්වය' ලෙස හැඳින්වූ අතර වර්තමානය වන විටද මාධ්‍ය ක්ෂේත්‍රය තුළ මෙම වචනය බොහෝ සෙයින් භාවිතා වේ. ඒ වෙනුවට සමරිසි යන වචනය භාවිතා කිරීමට ඉල්ලා සිටින්නේ 'සමලිංගික' යන්නෙන් පදානුගතව ලිංගික ක්‍රියාකාරකම් පමණක් අවධාරණය වන නිසාය. එමගින් සමරිසි පුද්ගලයින් අතර සිදුවන මානසික හා ආධ්‍යාත්මික සම්බන්ධතාවන් පැවසෙන්නේ නැති නිසාය.

සියලූම මිනිසුන් විෂම ලිංගික යැයි සිතමින් සිදුකරනු ලබන උපකල්පනය මත පිහිටා නීතිය, ප්‍රතිපත්ති හා සමාජ ආයතනවල ක්‍රියාකාරීත්වය සකස් වී තිබෙන නිසා එයට විෂම ලිංගික සාමාන්‍යත්වය (Heteronormativity) යැයි පැවසෙන අතර සියලූම පුද්ගලයින් විෂම ලිංගික විය යුතුය යන ආකල්පයේ පිහිටා සමරිසි පුද්ගලයින්ට කරදර කිරීම, වෙනස් කොට සැලකීම, ඔවුන්ව පිළිකුල් කිරීම හා ඔවුන් ආශ්‍රය

[2] Promoting and Protecting Human Rights in relation to Sexual Orientation, Gender Identity and Sexual Characteristics, A manual for National Human Rights Institutions, Asia pacific Forum.

කිරීමෙන් වැළකීම, ඔවුන් සම්බන්ධව කේලාම් පැවසීම යනාදිය සමරිසිභීතිකාව (Homophobia) යනුවෙන් හැඳින්වේ. සමරිසි පුද්ගලයින්ට වෙනස්කොට සැලකීම හා ඔවුන්ව අපහාසයට හා සමච්චලයට ලක්කිරීමේ අරමුණින් ඔවුන් සම්බන්ද වෙනත් අපහාසාත්මක වචන භාවිතයක්ද සිදුවේ. බොහෝවිට සාමාන්‍ය සමාජයේ පමණක් නොව, මාධ්‍ය ක්ෂේත්‍රයේ පවා මෙවැනි ආකාරයේ නම් පටබැඳීම හා අපහාසාත්මක ලෙස වචන භාවිතා කිරීම දැකිය හැකිය. සමරිසි පුද්ගලයින්ට පවතින්නේ සංක්‍රාන්ති සමාජභාවීය පුද්ගලයින්ට මෙන් තම අනන්‍යතාවය සම්බන්ධ ප්‍රශ්නයක් නොවේ. සංක්‍රාන්ති සමාජභාවීය ප්‍රජාව ඉල්ලා සිටින්නේ තමන්ගේ මනසින් ඉල්ලා සිටින ලිංගික අනන්‍යතාවය බවට පත්වීමට ඉඩ ලබාදෙන්න යන්නයි. එහි යම් ආකාරයක වෛද්‍ය විද්‍යාත්මක පැතිකඩක්ද පවතී.

එහෙත් සමරිසි පුද්ගලයින් ඉල්ලා සිටින්නේ තමා ආදරය කිරීමට කැමති පුද්ගලයා සමාන ලිංගිකයෙකු නම් තමන්ගේ ආකර්ශනය නීතියෙන් හා සමාජ දණ්ඩනයෙන් ඉවත් කරන්න යන්නයි. ශ්‍රී ලංකාවේ නීතියට අනුව සමරිසිභාවය අපරාධයක් වන අතර දණ්ඩ නීති සංග්‍රහයේ 365 සහ 365අ යන වගන්ති මගින් සමරිසි පුද්ගලයි-න් අපරාධකරුවන් බවට පත් කර තිබේ. 1883 දී සංග්‍රහ කරන ලද දණ්ඩ නීති සංග්‍රහයට අනුව සමරිසිභාවය යනු අපරාධයක් ලෙස සලකා දඩුවම් ලබාදිය යුතු වරදකි. එහෙත් දණ්ඩ නීති සංග්‍රහයේ මෙම වගන්ති නිසි පරිදි අර්ථකථනය වී නොමැති අතර ඒ නිසා සමරිසි පුද්ගලයින්ව රිසි ආකාරයට අත්අඩංගුවට ගැනීමට හා විවිධාකාරයේ අඩත්තේට්ටම් කිරීමට පොලීසියට හැකියාව ඇත. දණ්ඩ නීති සංග්‍රහයේ 365 අ වගන්තිය පහත දැක්වේ.

> "ප්‍රසිද්ධියේ හෝ අප්‍රසිද්ධියේ තවත් පිරිමියෙකු සමඟ කවර හෝ තදබල අශෝභන ක්‍රියාවක යෙදෙන හෝ එසේ කිරීමට තවත් අය සමඟ හවුල් වන හෝ වෙන යම් පිරිමියෙකු ලවා එසේ කිරීමට උත්සාහ කරන හෝ ප්‍රයත්න දරන ඕනෑම පිරිමියෙකු අපරාධයකට වරදකරු විය යුතු අතර, ඒ කවර හෝ පුද්ගලයා ඇතැම් විට දෙවසරක් දක්වා දීර්ඝ විය හැකි සාමාන්‍ය හෝ බරපතල සිර දඩුවමකට හෝ දඩයකට හෝ ඒ දෙකටම යටත් කළ යුතුය, කස පහරටද ලක් කළ යුතුය."

මෙම වගන්තියට අනුව ප්‍රසිද්ධ ස්ථානය යනු කුමක්ද, අප්‍රසිද්ධ ස්ථානය යනු කුමක්ද යන්න තීරණය කිරීමේ අයිතිය පොලිස් නිලධාරියාට ලබාදී ඇති අතර කවර හෝ තදබල අශෝබන ක්‍රියා යනු මොනවාදැයි අර්ථ ගන්වා නැත. ඒ අනුව සමරිසි පුරුෂයන් දෙදෙනෙකු අතර හා ස්ත්‍රීන් දෙදෙනකු අතර සිදුවිය හැකි ආදර සම්බන්ධතාවක් පවා අපරාධ ඇසින් බැලීමට පොලීසියට අයිතිය පවරා ඇත.

ශ්‍රී ලංකාවේ ජීවත්වන සමරිසි හා ද්විරිසි පුද්ගලයින්ට අදාළ ප්‍රශ්න ගණනාවක් පවතී. ඔවුන් මුහුණ දෙන ප්‍රධානතම ප්‍රශ්නය තම සම්බන්ධතාවල ස්වරූපය සම්බන්ධයෙන් සමාජ අනුමැතිය නොමැතිවීමයි. මෙහිදී සමාජ අනුමැතිය යනු සමරිසි විවාහ සඳහා අවසර ඉල්ලා සිටීම යැයි යනුවෙන් අදහසක් පසුගිය කාල සීමාව තුළදී මාධ්‍ය විසින් සමාජගත කිරීමට උත්සාහ ගන්නා ලදී. සමරිසි ප්‍රජාව සමාජයට අනුගත කිරීම හා සමරිසි විවාහ යනු හාත්පසින්ම වෙනස් කරුණු දෙකක් බව සිහි තබාගන්න. ශ්‍රී ලංකාවේ වෙසෙන සමරිසි ප්‍රජාව ඉල්ලා සිටින්නේ විවාහ වීමේ අයිතිය නොව සමාජය තුළ හිරිහැරයකින් තොරව ජීවත්වීමේ අයිතියයි.

අධ්‍යාපනය ලැබීමේ ප්‍රශ්න, සෞඛ්‍ය සේවාවන්ට ප්‍රවේශවීමේ ප්‍රශ්න, රැකියාවන්වල නිරතවීමේ හා උසස්වීම් ලබාගැනීමේ ප්‍රශ්න යනාදියට අමතරව විෂම ලිංගික විවාහයන් හා සම්බන්ධතා සඳහා පවුලෙන් හා සමාජයෙන් සිදුකරන බලකිරීම ප්‍රධාන වේ. සමරිසිභාවය සම්බන්ධව සමාජයේ පවතින විරෝධී ආකල්ප නිසා සමරිසි පුද්ගලයින්ගෙන් 80% ක් පමණ තමන්ගේ ලිංගික දිශානතිය රහසක් වශයෙන් තබාගන්නා අතර සමාජයෙන් කොන්වේ යැයි, අපහාසයට ලක්වේ යැයි බියෙන් තම සම්බන්ධතා රහසිගතව සිදුකරයි. එහෙත් ඔවුන් නිසි වයසට පැමිණෙන විට විෂම ලිංගිකයෙකු හා විවාහ වීමට පවුලෙන් බල කෙරෙන අතර සමහරවිට තම ලිංගික දිශානතිය නැතහොත් කැමැත්ත විවෘතව ප්‍රකාශ කළද, සමරිසි සම්බන්ධතාවලට පවතින අපහාසාත්මක ස්වභාවය නිසා ඔවුන්ගේ ඉල්ලීම් හා පාපොච්චාරණයන්ට දෙමව්පියන් සවන් දෙන්නේ නැත.

මෙම ගැටළුව නිසා පසුගිය කාල සීමාවේදී සමරිසි ප්‍රජාව සීඝ්‍ර වශයෙන් වෙනත් රටවල්වලට සංක්‍රමණය වූ අතර බොහෝ දෙනා එලෙස සංක්‍රමණය වීමට අවස්ථාවන් සොයමින් සිටී. එමෙන්ම තමන්ගේ ලිංගික දිශානතියට අදාළව ජීවත්වීමට නොහැකි නිසා හෝ, විවාහ වීමට නිවෙස්වලින් බල කිරීම නිසා හෝ තම ලිංගික අනන්‍යතාවය කෙසේ හෝ එළිදරවු වීම නිසා සමාජයෙන් අපහාසයට ලක් වූ සමරිසි පුරුෂයින් හා ගැහැණුන් විශාල පිරිසක් සියදිවි හානි කරගත් අවස්ථා එළිදරවු විය. බලහත්කාරයෙන් සමරිසියන් විවාහ කරදීම මගින් වඩාත් පීඩාවට පත්වන්නේ සමරිසි කාන්තාවන්ය. විශේෂයෙන් එවැනි විවාහ සම්බන්ධතාවකදී ලිංගික කාර්යයන්වල යෙදීම මඟහැරීමට හෝ එසේ නොකර සිටීමට හෝ සමරිසි පුරුෂයාට හැකි වුවද,

පවතින පුරුෂාධිපත්‍ය සමාජ රාමුව තුළ සමරිසි කාන්තාවකට එලෙස ප්‍රතික්ෂේප කළ නොහැකිය. ඔවුන්ට තමා අකමැති, තමන්ට නොදැනෙන පුරුෂයෙකු සමග බලහත්කාරයෙන් හෝ අකමැත්තෙන් ලිංගිකව එක්වීමට සිදුවන අතර එය ගෘහස්ත දූෂණයකට ලක්වීමකි. එමෙන්ම ඉහත සංක්‍රාන්ති සමාජභාවීය ප්‍රජාව සම්බන්ධයෙන් පැවසූ පරිදි සමරිසි ප්‍රජාව ද විවිධාකාරයේ මානසික විහීනතා හා මානසික අවපීඩන තත්ත්ව වලින් පීඩා විඳින අතර ඉහතින් දැක්වූ හේතු මත ඔවුන් සමහරවිට තමන්ටම වෛර කරගන්නා තත්ත්වයන් දක්වා පීඩා විඳිනවා විය හැකිය. පසුගිය වසර කීපය තිස්සේ EQUAL GROUND ආයතනයේ උපදේශන සේවාව අමතන සිය ගණනක් වූ සමරිසි පුද්ගලයින්ගේ කතාන්දරවල බහුතරයක් විවිධ ස්ථානවලදී විවිධ අය විසින් අපචාරයට හෝ හිරිහැරයට ලක් කළ කතාන්දර වන අතර නැතහොත් අකමැත්තෙන් විෂම ලිංගික විවාහයකට එළැඹුනු පසුව ඇති වූ ඛේදවාචක පිළිබඳවයි.

සමරිසියන් යනු කවුරුන්ද යනුවෙන් පොදු සමාජයෙන් අසනු ලැබුවහොත් ඔවුන් දෙන පිළිතුරු විය හැක්කේ මොනවාද?

01. "සමරිසි පුද්ගලයින් යනු මානසික රෝගීන් ය" යන අදහස.
02. "සමරිසි පුද්ගලයින් යනු සෙනෙහස් ප්‍රජාවක් නොව ලිංගික තෘප්තිය පමණක් සොයන අය වේ" යන මතය.
03. "සමරිසි පුද්ගලයින් ළමා කාමාතුරයෝ ය" යන අදහස.
04. "සමරිසි පුද්ගලයින් නූතන සමාජයේ මෑතකදී ඇතිවූවකි. එය බටහිර සංස්කෘතියේ ලක්ෂණයකි." යන අදහස.
05. "සමරිසි පුද්ගලයින් ක්‍රියාවක යෙදීම පාපයකි" යන අදහස.
06. "සමරිසි පුද්ගලයින් නිසා සමාජය පරිහාණියට ලක්වේ" යන මතය.
07. "සමරිසි පුද්ගලයින් ඒඩ්ස් ඇතුළු ලිංගික රෝග ව්‍යාප්තියට රුකුලකි" යන අදහස.

මෙම පිළිතුරුවලට සමාජය පැමිණ ඇත්තේ කෙසේද යන්න සොයා බැලීමේදී ඒ සඳහා අවශ්‍ය මතවාදයන් නිර්මාණය කර ඇත්තේ මාධ්‍ය මගින් බව පැහැදිලි වේ. 'සමරිසියන් යනු මානසික රෝගීන් ය' යන අදහස සමාජගත කරනු ලැබුවේ මනෝ විද්‍යාවේ මුල් අවධියේ දී සිදුකරන ලද යම් යම් සායනික අදහස් පෙරදැරි කරගෙනය. මේ නිසා සමරිසි පුද්ගලයින් අසාමාන්‍ය චර්යාවන් සහිත වූවන්ද යන ගැටළුවට පිළිතුර ඔබ දැනගත යුතුවේ. ඒ සඳහා පහත ප්‍රශ්න ඔබට පිළිතුරු ලබාදෙනු ඇත. මෙම ප්‍රශ්න හා මේවාට ලබාදෙන පිළිතුරු 2017.02.05 වන දින ඉරිදා දිවයිනට රචකයා විසින් මනෝ වෛද්‍ය චිත්තාහරී අභයනායක හා වෛද්‍ය රුවන් එම්. ජයතුංග සමග සිදුකළ සම්මුඛ සාකච්ඡාවක් ඇසුරින් උපුටා ගෙන සංස්කරණය කර ඇත.

**සමරිසිභාවය නැතහොත් සමලිංගිකත්වය මානසික රෝගයක්ය යන අදහස සම්බන්ධයෙන් මනෝවිද්‍යාව තුළ දැනට පවතින අදහස කුමක්ද?**

සමලිංගිකත්වය හෙවත් සමරිසිභාවය කිසිසේත්ම මානසික රෝගයක් වෙන්නේ නෑ. මානසික රෝගයක් යනු කුමක්ද කියන එක අපි මුලින් තේරුම් ගනිමු. පිළිගත් නිර්වචනයන්ට අනුව චෛතසික, ජෛවීය හෝ වර්ධනයේ ඇතිවන ගැටළුවක් හරහා පුද්ගලයෙක් තදබල පීඩාවකට පත් කරවන සංජානන (Cognition) චිත්තවේග පාලනය (Emotional Regulation) සහ හැසිරීම් (Behavior) වල බිඳ වැටීමක් තමයි මානසික රෝග කියන්නෙ. ඒවගේම සාමාන්‍ය ජීවිතයේ ඇතිවිය හැකි ආතතීන් නිසා ඇතිවන පීඩාකාරී තත්ත්වයන් (උදාහරණයක් ලෙස පවුලේ කෙනෙක්ගේ මරණයකදී ඇති වන දුක), සමාජයේ පොදු හැසිරීමට වෙනස් හැසිරීම් (දේශපාලනික, ආගමික හෝ ලිංගික), සහ සමාජය සහ පුද්ගලයා අතර ගැටීමෙන් ඇතිවන පිඩා මානසික නෙවෙයි. සරලව කියනවා නම් යම් හැසිරීමක් සමාජයේ බහුතරය අනුව සිදුනොවන නිසාවෙන් එය මානසික රෝගයක් වෙන්නේ නෑ. සමලිංගික චර්යාවවත්, වම් අතින් ලිවීමවත්, දේශපාලන උද්ඝෝෂණවලට සහභාගිවීමවත් මානසික රෝග නොවන්නේ ඒ නිසා.

**එසේනම් සමරිසිභාවය මානසික රෝගයක් ලෙස අතීතයේ සැලකුවේ ඇයි?**

සමරිසි චර්යා මානසික රෝග ලෙස සලකපු කාලයක් තිබුනා, එමෙන්ම පසු කාලීනව එය එසේ නොවන බව තේරුම් ගත්තා. එසේ වුන ආකාරය අපි බලමු. මධ්‍යතන යුරෝපයේ ආගමික මතිමතාන්තර හරහා සමරිසි චර්යා දරුණු අපරාධ ලෙස සලකමින් දැඩි දඬුවම් පමුණුවනු ලැබුවා. පුනුරුදයත් සමග යුරෝපය තමන් මෙතෙක් කළ දේ ගැන ප්‍රශ්න කිරීම් පටන් ගත්තා. විද්‍යාව, නව දැනුම විවිධ අංශ වලට යොදාගන්න පටන් ගත්තා. නීතිමය ක්‍රියාමාර්ග වලදී අපරාධයට සාක්ෂි ලෙස වෛද්‍ය පර්යේෂණවලින් ලබාගන්නා තොරතුරු වඩා විද්‍යාත්මක ලෙස පිළිගැනීමට ලක්කිරීම සිදුකරනු ලැබුවා. එමගින් වෛද්‍ය වෘත්තිකයන් විසින් ලිංගික

චර්යා සහ ඊට බලපාන හේතු පිළිබඳ සෙවීමේ උනන්දුව තවත් වැඩි කරන්න ඇති. ඔවුන් නිරීක්ෂණය කරපු දෙයක් තමයි ලිංගික දිශානතිය සහජයෙන් උරුම වන දෙයක් බවත් එය සිදුකරන කෙනා හිතාමතා සමලිංගික දිශානතියක් උරුම කරගන්නේ නැති නිසා එය අපරාධයක් ලෙස සැලකීම වැරදි බව ඔවුන්ට පෙනෙන්න ගත්තා. දඬුවම්දීම වැරදිබව පේන්න ගත්තා. දඬුවම් දීම වෙනුවට සහජයෙන් ලැබුණ දෙය වෙනස්කිරීමට ප්‍රතිකාර කිරීම වඩා වැදගත් බව අවධාරණය කරමින් අපරාධයක් ලෙස මෙතෙක් හැඳින්වූ චර්යාව රෝගයක් ලෙස නම් කරන්න පටන් ගත්තා. අද තියෙන දැනුමත් එක්ක ආපස්සට හැරිලා බලනකොට සාමාන්‍ය චර්යාවක් රෝගයක් ලෙස නම් කිරීම අමානුෂික සහ අවිද්‍යාත්මක ලෙස පෙනුනත් ඒ අවදියේ සමලිංගික චර්යාවල නිරතවූවන් අසාධාරණ ලෙස පීඩනයට පත් කරමින් දුන් දඬුවම් වලින් මුදාගැනීමට රෝගයක් ලෙස නම් කිරීම ඉවහල් වුන බව පිළිගන්න වෙනවා.

ඒ වගේම ඒ අවදියේ මානසික රෝග සහ ඊට පසුබිම් වන හේතු පිළිබඳ තිබූ දැනුම අදට සාපේක්ෂව අඩුයි, සුළුතරයක හැසිරීම් වගේම සමාජය සමග ඇතිවන ගැටීම්ද මානසික රෝග ලෙස ඒ කාලයේ සැලකුවා. තව තව හැදෑරීම් පරීක්ෂණ සමග මානසික රෝගයක් ලෙස හැඳින්වීම විවාදයට භාජනය වෙන්න පටන් ගත්තා. 19 වන ශතවර්ෂයේ අගභාගයේ සහ 20 වන ශත වර්ෂයේ මුල බාගයේ ජීවත් වූ හැව්ලොක් එලිස් යනු මානව ලිංගිකත්වය (Human Sexuality) බොහෝ විද්‍යාත්මක පර්යේෂණ වල නිරතවූ වෛද්‍යවරයෙක්. අදටත් ඔහුගේ සොයා ගැනීම් වෛද්‍ය විද්‍යාවේදී භාවිතා වෙනවා. ඔහු සැලකුවේ සමලිංගිකචර්යා සහජයෙන් එන ප්‍රබේදනයක් (Congenital Variation) විදියට, ඔහු එය රෝගයක් හෝ ආබාධයක් ලෙස සැලකීම ප්‍රතික්ෂේප කළා. එමෙන්ම මනෝවිශ්ලේෂණයේ පියා වන සිග්මන් ෆ්‍රොයිඩ් සමලිංගික චර්යා ගැන ඉතාම වැදගත් අදහස් වගයක් ප්‍රකාශයට පත් කළා. ඔහු සමලිංගික චර්යා මානසික රෝගයක් ලෙස සැලකීම එකහෙළාම ප්‍රතික්ෂේප කරා. ඒ වගේම ඔහු කිව්වා සමලිංගික දිශානතියක් තිබෙන කෙනෙක් විෂම ලිංගික දිශානතියක් තිබෙන කෙනෙක් බවට පත් කිරීම, විෂම ලිංගික දිශානතියක් තිබෙන කෙනෙක් සම ලිංගික දිශානතියක් තිබෙන කෙනෙක් බවට පත් කිරීම වගේම ඉතා අපහසු දෙයක් බව, ඒ කියන්නේ සමලිංගික දිශානතිය ප්‍රතිකාර මගින් වෙනස් කිරීමට බලාපොරොත්තුවීම ඵල රහිත බව. ඒ වගේම ඔහු කිව්වා සමලිංගික දිශානතියක් තිබීමත් සමලිංගික චර්යා තිබීමත් ගැන කෙනෙක් ලැජ්ජා නොවිය යුතු බව, ඔහු අත්දැකීමෙන්ම දැනගෙන හිටියා සමලිංගික දිශානතිය තිබෙන ශ්‍රේෂ්ඨ බුද්ධිමතුන්.

නමුත් පසුකාලීනව ඔහුගේ ගෝලයන් සමහරක් සමලිංගික දිශානතිය රෝගයක් ලෙස සලකන්නත් එයට ප්‍රතිකාර කළ හැකි බවටත් පවසන්න වුනා. මනෝවිශ්ලේෂණයදී වැඩි බරක් දමන්නේ ජීවවිද්‍යාත්මක කරුණු වලට නෙවෙයි යටි සිතෙහි ඇතිවෙනවායැයි කියලා සිතන ගැටුම් ගැන. ඒ වගේම ඔවුන් එසේ ප්‍රතිකාර මගින් දිශානතිය වෙනස් කිරීම ගැන පිළිගත් විද්‍යාත්මක අවස්ථා දුලබයි හෝ සාක්ෂි හමුවෙන්නේම නෑ. ඇමරිකාවේ මනෝවිද්‍යාවේ වැඩි බලවත් තැනක් හිමිකර ගෙන හිටියේ මනෝ විශ්ලේෂකයින්. ඔවුන්ගේ මතිමතාන්තර පළමු ඩී.එස්.එම්.1 (Diagnostic and Statistical Manual of Mental Disorders or DSM I) මානසික වර්ගීකරණයට බලපානවා, 1952 එළිදක්වන පළමු වර්ගීකරණයට මානසික රෝගයක් ලෙස සමලිංගික චර්යාව ඇතුල් වන්නේ එලෙසයි. ඒ වගේම මේ මනෝවිශ්ලේෂකයින්ට වගේම මනෝ වෛද්‍යවරුන්ටත් හමුවන්නේ මානසික ගැටළු තිබෙන අයයි. ඒ එන්නේ සමලිංගික දිශානතිය තිබෙන පුද්ගලයක් නම් අධ්‍යනය හරහා නිගමන වලට එන්න පුළුවන් සමලිංගික දිශානතියයි ගැටලූවලට මුල කියලා (ප්‍රතිකාර සඳහා එන සමලිංගික නොවන දිශානතිය තිබෙන අයගෙ ලිංගික දිශානතිය ගැන අධ්‍යයනය කරානම් විෂමලිංගික දිශානතියත් රෝගයක් ලෙස දකින්න තිබුනා, මොකද ඔවුනුත් ගැටළු තිබුන අය) මේ කරුණුත් එක්ක වර්තමානය වනවිට මනෝවිද්‍යාව සමරිසිභාවය රෝගයක් ලෙස පිළිගන්නේ නැහැ.

### එසේනම් වර්තමානයේදී සමරිසිභාවය පිළිබඳ මනෝ විද්‍යාව දරන අදහස කුමක්ද?

මානසික රෝග පිළිබඳ ලොව පිලිගත් ප්‍රධානතම වර්ගීකරණයන් දෙකක් පවතිනවා, ඒ වර්ගීකරණයන් මගින් මානසික රෝග මොනවාද යන්න නම් කර තිබෙනවා, ඒ දෙක තමයි ඇමෙරිකානු මනෝ විද්‍යා සංගමය මගින් 1952 වසරේ සිට එළි දක්වන ඩී.එස්.එම් (Diagnostic and Statistical Manual) සහ ලෝක සෞඛ්‍ය සංවිධානය මගින් එළි දක්වන අයි.සී.ඩී. (International Classification of Disease) එය 1949 සිට මානසික රෝග වෙනුවෙන් වෙළුමක් වෙන් කරනවා. ඒ දෙකෙහිම දැන් සමරිසි චර්යා රෝගයක් ලෙස නම් කර නෑ. ඒ කියන්නේ මනෝ වෛද්‍යවරුන් සායනික මනෝවිද්‍යාඥයින් ඇතුළු සෞඛ්‍ය ක්ෂේත්‍රයේ හා මේ හා අදාළව තීන්දු තීරණ ගන්නා නියාමන ආයතන කිසිවක් සමලිංගික චර්යාව මානසික රෝගයක් ලෙසවත් විකෘතියක් ලෙසවත් සලකන්නේ නෑ. එය විෂමලිංගක ක්‍රියාවගේම ප්‍රකෘති තත්ත්වයක්. ලංකාවේ සෞඛ්‍ය ක්ෂේත්‍රයේ පිළිගැනීමත් මේකමයි. සමරිසි චර්යාවන් මානසික රෝගයක්වත් විකෘතියක් වත් නොවන බවට තිරණය කලේ බොහෝ කරුණු සලකා බලා, විද්‍යාවේ දියුණුවත් සමග ලැබුනු නව දැනුම උපයෝගීකරගෙන.

**ඒ කියන්නේ සමරිසිභාවය මානසික රෝගයක් හෝ ඇබ්බැහියක් නොවේ.**

විද්‍යාත්මක සොයාගැනීම් අනුව වර්තමානයේ සෞඛ්‍ය ක්ෂේත්‍රය සහ එය නියාමයන කරන ආයතන සියල්ලමත් සමරිසිභාවය මානසික රෝගයක් හෝ ඇබ්බැහියක් නොවන බව තේරුම්ගෙන අවසානයි. වෛද්‍යවරුන්ට පෞද්ගලිකව විවිධ අදහස් සමරිසිභාවය පිළිබඳව තිබෙන්න පුළුවන්, ඒවා තමන්ගේ ආගමික දේශපාලනික මෙන්ම කුඩාකල සිට තිබූ අගයන්, විශ්වාස සහ පෞද්ගලික රුචි අරුචිකම් මත ගොඩ නැගෙන ඒවා. නමුත් ඒ මතිමතාන්තර අදාළ වෙන්නේ නෑ. අදාළ වෙන්නේ විද්‍යාත්මක සාක්ෂි මොනවාද දැනුම මොනවාද යන්න පමණයි. ඒ අනුව සමරිසිභාවය මානසික රෝගයක් නෙවෙයි.

'සමරිසිභාවය යනු මෑතකදී ඇති වූ දෙයක්ය යන්න' ද මාධ්‍ය මගින් නිරන්තරව ඉස්මතු කිරීමට වෑයම් දරන අදහසකි. විශේෂයෙන් පෙරදිග සංස්කෘතිය තුළ මෙවැනි හැසිරීම් නොතිබුණ බවත්, මෙම හැසිරීම් විදෙස් රටවල් වලින් ආනයනය කළ ඒවා බවත්ය යන අදහස තහවුරු කිරීමට දරන උත්සාහය මාධ්‍ය වාර්තා විමර්ශනය කිරීමෙන් පෙනී යයි. එහෙත් සත්‍ය තත්ත්වය එය නොවේ. එකගෙයි කෑම, බින්න විවාහය, බහු පුරුෂ විවාහය, බහු භාර්යා විවාහය, යකඩ දෝලී විවාහය, උසස් තැනැත්තෙක් වෙනත් ගමකට පැමිණි පසු එම ගමේ ගැහැණියක් සංග්‍රහ කිරීම යනාදී වශයෙන් ලිංගිකත්වය සම්බන්ධ නිදහස් පරිසරයක් පැවති සමාජ ක්‍රමයක් පැවති ශ්‍රී ලංකාව තුළ ඉතිහාසයේ සමරිසියන් සිටියේ නැතැයි තර්ක කළ නොහැකිය. මේ සම්බන්ධ කදිම උදාහරණ දෙකක් පහතින් දැක්වේ.

> "සමලිංගික පව කෝට්ටේ රාජධානිය පුරා පැතිර ඇති අතර, මෙහි ජීවත් වීම ගැන අපට දැනෙන්නේ බයකි. රාජධානියේ වෙසෙන වැදගත් නායකයෙකු වෙත ගොස් මෙවැනි කැත ක්‍රියාවක් ගැන ලැජ්ජා නොවන්නේ දැයි ඇසූ කල, ඔහු පිළිතුරු දෙන්නේ, රජ විසින් යමක් කරන්නේ නම් එය අපේ චාරිත්‍රය වෙන බවයි. (1547 නොවැ. 27, පෘතුගීසින් විසින් ඉන්දියාවේ සිටි ඩී. ජොවාවෝ ද කැස්ත්‍රෝ උප පාලකයාට යැවූ ලිපියක් ඇසුරිනි.)

> "රජතුමාගේ බොහෝ සේවකයන් වූයේ කොල්ලන්ය, තරුණ පිරිමින්ය. හොඳ පවුල්වලින් එන කඩවසම් අයය. දිසාවේලා හෝ රටේ මහත්තුරු හරහා එවැනි කොලු ගැටව් තෝරා ගැනෙන අතර යහපත් පෙනුමැති, හොඳ පවුල් පසුබිමක් සහිත අය තෝරා මාළිගාවට එවේ. මේ කොලුවන්ගේ හිසකෙස් බූ ගාන අතර කෙස් පිටුපසින් එල්ලෙයි. රජුට සමලිංගික හැසිරීම සම්බන්ධයෙන් වරදක් නොදැනුනු අතර, ඔවුන් අතර එවැනි පවක් ගැන කතා වෙනු ද මම කිසිම දිනක නොඇසුවෙමි. (සිලෝන් දූපතේ ඓතිහාසික සම්බන්ධතා, රොබට් නොක්ස්. 1681)

ඉහතින් දක්වන ලද උපුටාගැනීම් දෙක සමරිසිභාවය පිළිබඳ ශ්‍රී ලාංකේය ඉතිහාසයට උදාහරණ සපයයි. පළමුවැන්න පෘතුගීසි නිලධාරීන් විසින් "අශික්ෂිත අපරාධයක්" ලෙස සමරිසිභාවය හුවාදක්වමින් ඔවුන්ගේ පාලකයන්ට යැවූ ලිපියක එක් සඳහනක්ය. එමගින් බරපතල ලෙස අභියෝගයට ලක්කෙරෙන්නේ ක්‍රි.ව. 1524-1551 කාල සීමාව පිළිබඳවයි. VII වන බුවනෙකබාහු රජතුමා පිළිබඳවයි. දෙවැන්න ශ්‍රී ලාංකේය ඉතිහාසය, ඇඳුම් පැළඳුම්, ආහාර පාන, චාරිත්‍ර වාරිත්‍ර හා සංස්කෘතිය සොයායාමේදී අපට හමුවන වැදගත්ම මූලාශ්‍රය වන රොබට් නොක්ස්ගේ ඓතිහාසික කෘතියයි. මෙම උදාහරණ දෙක මගින් ප්‍රතීයමාන වන්නේ සමරිසිභාවය ශ්‍රී ලංකාවට අලුත් දෙයක් නොවන බවයි.

සමරිසිභාවය සම්බන්ධයෙන් මාධ්‍ය විසින් සමාජයට වපුරන ලද අනෙක් අදහස වන්නේ ශ්‍රී ලංකාවේ ප්‍රධාන ආගම වන බුදු දහම සමරිසිභාවය අනුමත නොකරන බවයි. එමෙන්ම බුදුන් වහන්සේ විසින් අනුදැන වදාළ ආකාරයට 'පණ්ඩකයින්' මහණ කිරීමට සුදුසු නොවේ. මාධ්‍යවේදීන් විසින් පණ්ඩකයින් යනු සමරිසි ප්‍රජාව යැයි වැරදියට තේරුම් ගෙන ඇති බව පෙනේ. පණ්ඩක යන පදයෙහි අර්ථය සොයා යාමේදී 'ලිංග දෙකෙහිම ලිංගික ලක්ෂණ ඇති පුද්ගලයා (උභතොබ්‍යඤ්ජනක)' හා 'වෘෂණ කෝෂ නැති තැනැත්තා (පණ්ඩක)' ආදීන් බුදුසසුනේ මහණ කිරීමට නුසුදුසුය. (උපුටාගැනීම: පීටර් හාවි, 2000, බෞද්ධ සදාචාරයට හඳුන්වාදීමක් කෘතිය) යනුවෙන් බුදුන් වහන්සේ විසින් සඳහන් කර ඇති බවට විනය පිඨකයේ සඳහන් වේ. වෘෂණ කෝෂ නොමැති පුද්ගලයින් හඳුන්වන්නේ අන්තර්ලිංගික අර්ථයෙන් විනා සමරිසි අයට නොවන බව පැහැදිලි කරගත යුතුය. බුද්ධඝෝෂ හිමියන් විසින් (01) අසිත්ත පණ්ඩක, (02) උසූය පණ්ඩක, (03) ඔපාක්කමික පණ්ඩක, (04) පක්ඛ පණ්ඩක හා (05) නපුංසක පණ්ඩක යනුවෙන් පණ්ඩක වර්ග පහක් සඳහන් කර ඇති අතර එයින් අදහස් කර ඇත්තේ ලිංගික වශයෙන් අපගාමී පිරිස් ගැන විනා සමරිසි අය පිළිබඳව නොවේ. බුදුන්වහන්සේ විසින් භික්ෂු ශාසනයට ඇතුළත් කරගත නොයුතු පුද්ගලයින් ලෙස ඉදිරිපත්කළ අර්ථ දැක්වීම පදනම් විරහිත ආකාරයෙන් අපහාසය සඳහා භාවිතා කිරීමට බොහෝ මාධ්‍යවේදීන් උත්සාහ දරා තිබුණි.

මාධ්‍යවේදීන් වශයෙන් හා සමාජ ක්‍රියාකාරීන් වශයෙන් ඇත්ත වශයෙන්ම ඔබ විසින් සිදුකළ යුත්තේ සමරිසියන් හෝ සංක්‍රාන්ති සමාජභාවීය පුද්ගලයන් යනු කවුරුන්ද? ඔවුන්ට එසේ සිදුවූයේ ඇයි? ද යන්න සොයාබැලීම නොව ඔවුන්ට එරෙහිව පවතින සමාජ ක්‍රමය වෙනස් කිරීම සඳහා අවශ්‍ය දැනුම ලබාගැනීමයි. දෙවනුව එම දැනුම නිවැරදිව සමාජගත කිරීමයි. ඔබ සාමාන්‍ය සමාජයේ සම්මත සමාජ හා සංස්කෘතික මතවාදවලින් පෝෂණය වූ අයෙකු විය හැකිය. එහෙත් සිදුවීම්, කතාන්දර හා ප්‍රවෘත්ති වාර්තා කිරීමේදී ඔබගෙන් බලාපොරොත්තු වන්නේ අපක්ෂපාතී මාධ්‍ය භූමිකාවයි. ඒ සඳහා අවශ්‍ය දැනුම හා සංවේදීභාවය ඔබ තුළ යම් ප්‍රමාණයකින් ගොඩනැගුනා යැයි අපි විශ්වාස කරමු. මීළඟ පරිච්ඡේදයෙන් විස්තර කෙරෙන්නේ විවිධ ලිංගික අනන්‍යතා සහිත ප්‍රජාව පිළිබඳ වාර්තා කිරීමේදී මාධ්‍ය ආචාර ධර්ම ආරක්ෂා කළ යුත්තේ කෙසේද යන්නයි.

# විවිධ ලිංගික අනන්‍යතා සහිත ප්‍රජාව සම්බන්ධ වාර්තාකරණය හා මාධ්‍ය ආචාරධර්ම

විවිධ ලිංගික අනන්‍යතා සහිත ප්‍රජාව පිළිබඳ මාධ්‍ය වාර්තාකරණය වෙනත් මාධ්‍ය වාර්තාකරණය හා කිසිසේත්ම සමාන කළ නොහැකිය. එයට හේතුව බොහෝ මාධ්‍යවේදීන් පවසන පරිදි මාධ්‍ය තරඟය, කේලාම් සහ උණු කැවුම් මෙන් අලෙවි වන ප්‍රවෘත්ති කැලි, නැගලා යන සිද්ධි, එක ප්‍රවෘත්තියකින් ප්‍රවෘත්ති කැලි විශාල ප්‍රමාණයක් ලිවිය හැකිය යනාදී ජන මාධ්‍යයන්හි සාමාන්‍ය භාවිතාවන් මෙම ප්‍රජාව සම්බන්ධයෙන් අදාළ නොවන නිසාය. මාධ්‍ය ආචාරධර්මවල කියැවෙන මුල්ම අකුරු වන්නේ 'තම ලිවීමෙන් හෝ වාර්තාකරණයෙන් හැකිතාක් පුද්ගල හානි සිදු නොකිරීමට වග බලාගන්න යන්නයි'. පුද්ගලයින්ගේ කීර්ති නාමයට, ආත්ම ගරුත්වයට හෝ මානව හිමිකම්වලට සීමා පැනවෙන ආකාරයෙන් හෝ හානිදායක වන ආකාරයෙන් ප්‍රවෘත්ති පළ කිරීම මාධ්‍ය සදාචාරය නොවේ. විශේෂයෙන්ම විවිධ ලිංගික අනන්‍යතා සහිත ප්‍රජාව යනු ශ්‍රී ලංකාවේ ආන්තීකරණයට ලක්වූ අවදානම් සහගත ප්‍රජාවක් වන නිසා ඔවුන් සම්බන්ධ මාධ්‍ය වාර්තාකරණය තව තවත් මිනිසුන් කුපිත කරන ආකාරයේ හෝ ඔවුන් පිළිබඳ පිළිකුලක්, අපහාසයක් ඇති කරවන ආකාරයේ ඒවා නොවිය යුතුය. අප විසින් මෙය වඩ වඩාත් අවධාරණය කරන්නේ මාධ්‍ය හා සමාජය අතර ඇති සම්බන්ධතාව එන්න එන්නම පුළුල් වෙමින් පවතින අවස්ථාවක මාධ්‍යවේදී ඔබගේ එක් වචනයක් අවභාවිත වීම පවා ඔවුන්ගේ ජීවිතවලට මහත් තර්ජනයක් විය හැකි නිසාය. පසුගිය කාලසීමාවේදී මාධ්‍ය විසින් සිදුකළ එවැනි මානව හිමිකම් උල්ලංඝණයන් කිහිපයකට උදහරණ පහතින් දැක්වේ.

> "වින්දනයක් ලබාගැනීමට හෝ මුදල් සෙවීමට අඳුරු කාලයේ මහමඟට හෝ පාළු තැන්වලට ඇදෙන සමකාමීන් නිසා බාල පරම්පරාව ලිංගික කටයුතුවලට යොමුවන අවස්ථා බහුලය."
> (මිත්‍ර ශ්‍රී කරුණානායක - ඉරිදා දිවයින 2017.02.12)

> "මොවුන් නිතරම වාගේ පොදු වැසිකිළි අස්සේ ගැවසෙන අතර පාසල් දරුවන්, වයස 25 ට අඩු පිරිමි දරුවෝ සමහර අයගේ ඉලක්කය වෙති."
> (ප්‍රගීත් සම්පත් - මව්බිම 08.10.2017)

> "සමලිංගික යොමුවක් ඇති පුද්ගලයින් පරීක්ෂණයට ලක්කිරීමෙන් සොයාගෙන ඇති එකම කරුණ වන්නේ ඔවුන්ගේ මොළයේ හයිපොතැලමසය නම් කොටස විෂම ලිංගිකයින්ට වඩා දෙගුණයක් විශාල වන බවයි."
> (සමුනි සමරකෝන් - දිවයින 26.01.2017)

> "පිරිමියෙකු වීම සඳහා අවශ්‍ය ටෙස්ටස්ටරෝන් ප්‍රමාණය අඩුවීමෙන් මොළයේ ලිංගික නැම්යාව වෙනස්වේ. උපතින් පිරිමියෙකු වන අය මනසින් ගැහැණියක වන්නේ මේ නිසාය."
> (වෙනුර සනත් කුමාර - දිවයින 15.12.2017)

> "සුන්දර විවාහයේ පදනම ස්ත්‍රී පුරුෂ මනෝ කායික සම්භෝගයයි. එහෙත් මෙම මනෝ ජීව විද්‍යාත්මක සත්‍යය අභියෝගාත්මකව දෙදරුම් කෑමට ලක්වන අස්වාභාවික හා සදාචාරාත්මක නොවන ලිංගික චර්යාවන් ලෙසට සමලිංගිකකරණය මෙම සියවසේ ආරම්භයේ සිටම සෑම රටකම ව්‍යාප්ත වෙමින් පවතී."
> (ආර්. ඩබ්. අමරසිංහ - සිළුමිණ 19.02.2107)

"සමලිංගිකත්වය නීතිගත කර තිබෙන රටවල මෙම තත්ත්වය ගැටළුවක් නොවන්නේ එම රටවලට වෙන රටවල ඉගෙනගත් තරුණ තරුණියන් ගෙන්වා ගෙන දරුවන් බිහි කරන බැවිණි." (තිලක් මනම්පේරි - ලංකාදීප 01.02.2017)

"මෙහි දැකිය හැකි තවත් පැතිකඩක් තිබේ. එනම් තරුණියන්ට වඩා තරුණයින් බහුල වශයෙන් සමලිංගික සේවනයට යොමුවීමය. ඊට බලපාන එක හේතුවක් නම් පවුල් සංස්ථාවේදී තරුණියට (දුවට) ලැබෙන ආරක්ෂාව හා උපදෙස් තරුණයාට (පුතාට) නොලැබීමය. විශේෂයෙන් වැඩිවියට පත්වන දියණියට ආරක්ෂා විය යුතු අන්දම මව් පාර්ශවයෙන් නිසි උපදෙස් හා ආරක්ෂාව ලැබෙන නමුත් පවුලක පිරිමි දරුවෙකු සම්බන්ධයෙන් එවැනි තත්ත්වයක් දක්නට නොලැබේ. ඒ පසුබිමේ වැඩිහිටි පිරිමියෝ පිරිමි දරුවන් සමලිංගික සේවනය සඳහා යොමු කරවා ගනිති." (උපාලි වික්‍රමසිංහ - ලංකාදීප 22.01.2017)

මේ පසුගිය කාල සීමාවේ පළවූ ලිපිවලින් කිහිපයක් පමණි. මෙම ලිපිවල අන්තර්ගතය විමසා බලන කල්හි පෙනීයන්නේ ලිපිවල අන්තර්ගතය කෙසේ වෙතත් ඉතා බරපතල ලෙස මාධ්‍ය ආචාරධර්ම හා සමරිසි ප්‍රජාවට අදාළ මානව හිමිකම් උල්ලංඝණය කර ඇති ආකාරයයි. මෙම ලියවිලිවල කිසිදු හරයක් නොමැති අතර මූලාශ්‍ර පරිශීලනයෙන් තොරව හිතු මනාපෙට තමන් තුළ ඇති ආකල්ප හා අදහස් වපුරා ඇති බව පෙනේ. වින්දනයක් ලබාගැනීම සඳහා අඳුරු ස්ථානවලට සමකාමීන් යන්නේ බාල පරම්පරාව ඒවාට යොමු කරවා ගැනීමට නම් බාල පරම්පරාවේ අය පේළියක් සැදි අඳුරු අහුමුළුවල සිටිය යුතුය. සමරිසි පුද්ගලයින් ලවා අපචාරයට ලක් කරගැනීමට බලා සිටිය යුතුය. ඉහතින් දැක්වූ පරිදි සමරිසි ප්‍රජාව සම්බන්ධයෙන් පවතින තවත් චෝදනාවක් සනාථ කිරීමකි මේ. පිරිමි දරුවන් අපයෝජනය කරන පිරිමි වැඩිහිටියන් කිසිසේත්ම සමරිසි පුද්ගලයින්ම නොවේ. ඔවුන් තරුණියක්, ගැහැණියක්, මිත්තනියක් හෝ දැරියක් තම ගොදුර කර ගැනීමට මාන බලමින් සිට එසේ නොහැකි වූ කල පිරිමි ළමයෙකු අපචාරයට ගොදුරු කරගන්නෙක් වේ. සමරිසිභාවය පිළිබඳ නිර්වචනයේදීම දැක්වූ ආකාරයට සමරිසි වීම යනු ලිංගික දෙයක් පමණක් නොවේ. එය මානසික හා ආධ්‍යාත්මික ආකර්ශනයක්ය යන්න අමතක නොකළ යුතුය. දෙවැනි උදාහරණයේ දැක්වූ ආකාරයට සමරිසි පුරුෂයන් යනු පොදු වැසිකිළිවල දරුවන් හා වයස අවුරුදු 25ට අඩු තරුණයන් ඩැහැ ගැනීමට මාන බලමින් සිටින අය වේ. මෙවැනි ලිවීම් මගින් පාඨකයා තුළ යම් කුතුහලයක් ඇති කළ හැකි වුවද, එමගින් අදාළ ප්‍රජාවට සිදුවන හානිය පැවසිය නොහැකි තරම්ය. වයස අවුරුදු 25 ට අඩු තරුණයින් යැයි දැක්වීමට යොදාගත් නිර්ණායකය කුමක්දැයි අප විසින් ලේඛකයාගෙන් අසා දැනගත යුතුය.

තවත් වාර්තාකාරිණියක් දක්වන ආකාරයට සමරිසියන් සම්බන්ධ පර්යේෂණවලින් සොයාගෙන ඇත්තේ එකම එක කාරණයක් පමණි. ඒ සමරිසියන්ගේ මොළයේ හයිපොතැලමස විෂම ලිංගිකයන්ගේ හයිපොතැලමස මෙන් දෙගුණයක් විශාල වන බවයි. මේ කියමන අසත්‍ය කියමනක් පමණක් නොව වෛද්‍ය සභාවට යොමු කර වාර්තාකාරිණියට දඬුවම් ලබාදිය යුතු තරම් සාහසික අසත්‍යයකි. සියලුම මිනිසුන් ශරීර ප්‍රමාණයන්ගෙන් එක හා සමාන වන අතර සමරිසියන් යනු හැඟීම්, ජාන හා හෝමෝනවල ස්වභාවය අනුව සමාන ලිංගිකයෙකුට ආකර්ශනය වන අයෙකු විනා හයිපොතැලමස විශාල අයෙක් නොවේ. තවත් වාර්තාකරුවෙකුට අනුව විවාහය සුන්දරවීමට නම් ස්ත්‍රී පුරුෂ කාම සම්භෝගය එහි පදනම විය යුතුය. අප සිතන ආකාරයට විවාහ ජීවිතයක් සාර්ථක වන්නේ ස්වාමි පුරුෂයා හා භාර්යාව එකිනෙකා තේරුම් ගන්නා ආකාරය හා එකිනෙකාට ගරුකරන ආකාරය මතය. එකිනෙකා දුක සැප බෙදාගන්නා ආකාරය මතය. ඔහු තවදුරටත් දක්වන්නේ සමරිසියන් නිසා මෙම කාම සම්භෝග සත්‍යය දෙදුරුම් කන බවයි. ආසියානු රටවල්වල සිදුකරන ලද පර්යේෂණවලට අනුව ජනගහණයක් තුළ සමරිසියන් ඇතුළු විවිධ ලිංගික අනන්‍යතා සහිත ප්‍රජාවගේ සම්පූර්ණ ප්‍රතිශතය 6-10% ත් අතර වේ. ඒ අනුව වාර්තාකරුවා පවසන මනෝ කාම සම්භෝගය කිරීමට ජනගහණයෙන් 90-94% ත් අතර විෂම ලිංගිකයින් ප්‍රමාණයක් සිටී. එමෙන්ම සමරිසි අයිතිවාසිකම් සම්බන්ධ අරගලය 21 වන සියවසේ ආරම්භ වූවක් නොව සියවස් ගණනාවක් පුරා සාකච්ඡාවට හා භාවිතයට ලක්ව 1969 ජූනි මාසයේදී සිදුවූ සිදුවීමක් පාදක කරගෙන ලෝකය පුරා ව්‍යාප්ත වූ අරගලයකි. මෙම අරගලය හා අයිතිවාසිකම් ඉල්ලා සිටීම වසර පණහකටත් වඩා පැරණි අතර නිරවද්‍ය තොරතුරු ලබාදීමෙන් තොරව පාඨකයා නොමග යවා ඇති බව පෙනේ. තවත් එක් වාර්තාකරුවෙක් විසින් සිනහ යන ආකාරයේ ලිපියක් ලියා තිබේ. එය සමරිසියන් නිසා ජනහණය පාලනය වේය යන පදනමෙන් යුතුව ලියූවක් වූ අතර ඔහු පවසන්නේ සමරිසිභාවය හා සමරිසි විවාහ නීතිගත කර තිබෙන රටවල් ඔවුන්ගේ ජනගහණය පාලනය නොවීමේ උපක්‍රමයක් ලෙස වෙනත් රටවල්වල උගත් තරුණ තරුණියන් තම රටට ගෙන්වා දරුවන් සාදාගන්නා බවයි. ඔහුගෙන් ඇසිය යුතු පළමු ප්‍රශ්නය උගත් තරුණ තරුණියන් හා දරුවන් ඉපදීම අතර සම්බන්ධය කුමක්ද යන්නයි. වෙනත් රටවල් වල තරුණ තරුණියන් සංවර්ධිත හා මානව හිමිකම් වලින් පෝෂණය වී ඇති රටවල්වලට සංක්‍රමණය වන්නේ එම රටවල්වල ජනගහණය වර්ධනය කිරීමට නොව හොඳ

අධ්‍යාපනයක්, යහපත් ජීවන ක්‍රමයක් අපේක්ෂාවෙනි. ඔවුන්ගේ රටවල්වලට ගොස් දරුවන් සෑදීමට වඩා ශ්‍රී ලංකාව වැනි දැඩි භීතිකාවලින් හා අසහනයෙන් පිරුණු, දේශපාලනය මගින් ජන ජීවිතය විනාශ කර තිබෙන රටවලින් පිටත්වීමට ඔවුන් අවස්ථාව සොයමින් සිටින නිසාය.

අවසන් උපුටා දැක්වීමට අනුව තරුණියන්ට වඩා තරුණයින් සමරිසි සේවනයට යොමුවීම වැඩි බව දක්වා තිබේ. එසේ ලියා ඇත්තේ කුමණ සංඛ්‍යා ලේඛන මත පදනම්ව දැයි දක්වා නැත. එම රචකයාට අනුව පිරිමි දරුවන් සමරිසි වීමට වගකිව යුතුතේ දෙමව්පියන්ය. ඔවුන් සමරිසිවන්නේ ඔවුන්ගේ ජාන හෝ කැමැත්ත මත පදනම්ව නොවේ. අම්මා විසින් හොඳ නරක කියා දෙමින් ආරක්ෂාව ලබාදුන්නේ නැති නිසාය. දුවට පමණක් යහමග පෙන්වූ නිසාය. ඒ මහතා සමහරවිට ලංකාවේ ස්ත්‍රී දූෂණ, ගබ්සාවන්, ළමා මව්වරුන්, කොළඹ පමණක් 40,000 ක් පමණ වන ලිංගික ශ්‍රමයේ යෙදෙන කාන්තාවන්, හෙරොයින් වැනි මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වූ කාන්තාවන් ගැන අසා නොමැති වන්නට ඇත. මෙම සියලු ලිපිවලින් පෙනෙන්නේ හුදෙක් කුණු රසය ඇතිකිරීම හා සමරිසියන් ඇතුළු විවිධ ලිංගික අනන්‍යතා සහිත ප්‍රජාව සම්බන්ධයෙන් අප්‍රසන්න භාවයක්, සමාජය තුළ වෛරයක් ඇතිකිරීමේ අරමුණින් පමණක් පුවත් පත් වාර්තාකරණයේ යෙදෙන බවයි. මෙයට බලපාන විශාලතම හේතුව වන්නේ මාධ්‍ය නියාමනයක් හෝ මාධ්‍ය ආචාරධර්ම පිළිබඳ ඇගයීමක් හෝ නොමැතිවීමයි. මේ නිසා නිවැරදි හා සංවේදී මාධ්‍යකරණයක් සඳහා අවශ්‍ය මාර්ගෝපදේශවල කඩිනම් අවශ්‍යතාව ඉස්මතු වෙමින් තිබේ. විශේෂයෙන් සමරිසි ප්‍රජාව ඇතුළු විවිධ ලිංගික අනන්‍යතා සහිත ප්‍රජාව සම්බන්ධයෙන් මාධ්‍ය වාර්තාකරණයේදී නිවැරදි තොරතුරු ඇති සැටියෙන් ඉදිරිපත් කිරීම වැදගත් වේ.

පහත දැක්වෙන ලිපියේ ශීර්ෂය හා අන්තර්ගතය බලන්න. පසුගිය වසරේදී දඹුල්ල ප්‍රදේශයේදී අභිරහස් ලෙස සංක්‍රාන්ති සමාජභාවීය පුද්ගලයෙකු යැයි සැලකිය හැකි ආකාරයේ තැනැත්තෙකු මරා දමා තිබුණි. ඇත්ත වශයෙන්ම ඔහු හෝ ඇය නියම වශයෙන්ම මරා දැමුවේ මාධ්‍ය මගිනි. විවිධ මාධ්‍ය විවිධාකාරයෙන් මෙම සිදුවීම වාර්තා කර තිබුණු අතර, “දඹුල්ල පොලීසියේ නිලධාරියෙකුගෙන් ලද විශ්වාසදායී ආරංචියකට අනුව, මරා දැමුණු පුද්ගලයාගේ අක්කාට අනුව” යනුවෙන් දක්වමින් මෙම මරණය සම්බන්ධයෙන් විවිධ අර්ථකථන ලබාදීමට උත්සාහ කර තිබුණි. මිනිසුන් බෙදාගැනීමට නොහැකිව සිදුවූ සංක්‍රාන්ති ලිංගිකයින්ගේ ගැටුමක් වශයෙන්ද දක්වා තිබුණි. ශ්‍රී ලංකාවේ දිනකට සිදුවන මිනීමැරුම් ප්‍රමාණයට අනුව හා එම මිනීමැරුම් සිදුවන කුරිරු ස්වභාවයට අනුව මෙම සිදුවීම මගින් ඇඟ කිලිපොලා යන්නේ කෙසේදැයි පහත වාර්තාව ලියූ අයගෙන් ඇසිය යුතුය. විශේෂයෙන් මෑත කාලීනව හතු පිපෙන්නාක් මෙන් ආරම්භ වන විවිධ වෙබ් අඩවි හා ෆේස්බුක් පිටු මගින් ඇතිකරවන බලපෑම සුළුපටු නොවේ.




දඹුල්ලේදී අබිරහස් ලෙස විනාශ කල ගැහැණු ඇඳුම් ඇඳ සිටි තරුණයාගේ සිද්ධියේ සියල්ල කරලියට. – Lanka Rahas Info

LANKARAHAS.INFO

පහතින් දැක්වෙන්නේ අදාළ සිදුවීම ලංකාවේ ප්‍රසිද්ධ මාධ්‍ය කිහිපයක් මගින් වාර්තා කර තිබූ ආකාරයයි.

| පුවත්පතේ නම | වාර්තාකරුගේ නම | සිරස්තලය | ඝාතනය වූ අයගේ ඡායාරූපය |
|---|---|---|---|
| ජනයුගය | දිනේෂ් ආරච්චිගේ නාමල් කොරාළ | දඹුලු රෝහලේ රථගාලේ පිරිමි මළ සිරුරක් මියගිය පුද්ගලයා කාන්තා ඇඳුමෙන් සැරසී නගරයේ සැරිසරන්නෙකු බවත් හෙළිවෙලා. | පළවී නැත |
| Daily Mirror | කේ කේ ආරියදාස තිලංක කනකරත්න | Cross dresser killed in Dambulla. | පළවී නැත |
| රිවිර | සමිලා කරුණාරත්න | කාන්තා වෙස්ගත් තරුණයා පොලුවලින් ගසා මරා දමයි. | පළවී ඇත |
| දිවයින | සරත් එරමිනිගම්මන | කාන්තාවක මෙන් ඇඳ රැට ඇවිදින පුද්ගලයාට ගහලා මරලා | පළවී නැත |
| ලංකාදීප | කේ කේ ආරියදාස | දඹුල්ලේ කුලීරථ නැවතුමේදී පහරදී තරුණයෙකු මරලා. | පළවී ඇත |
| මව්බිම | කේ කේ ආරියදාස දිනේෂ් ආරච්චිගේ නාමල් කොරාළ | කාන්තා ඇඳුමින් දඹුල්ල නගරයේ සැරි සැරූ තරුණයෙකු මරා දමලා. | පළවී ඇත |
| අද | සමිලා කරුණාරත්න | දඹුල්ල කුලීරථ නැවතුම්පොළේ තිබී මළසිරුරක් සොයා ගැනේ. | පළවී ඇත |
| தினகரன் | පළවී නැත | Man murdered in a suspicious way in Dumbulla | පළවී නැත |
| தினக்குரல் | පළවී නැත | A corpse of a man found from a vehicle park | පළවී නැත |

දිනමිණ ලක්බිම පුවත්පත් මෙම සිදුවීම අද දිනයේ වාර්තාකර නැත. 2017/09/06 ETHICS E

ඉහත ශීර්ෂ පාඨ කියවූ පමණින්ම ඔබට ලංකාවේ මාධ්‍ය හැසිරීම තේරුම් යනු ඇත. මාධ්‍යකරණයෙහි තිබිය යුත් ශෝභමාන බව වත් අඩුම තරමේ මෙවැනි ලියවීම්වලින් ආරක්ෂා වන්නේ නැත. මාධ්‍යවේදීන්ට වඩා ලියන්නන් වශයෙන් හැඳින්විය හැකි ආකාරයේ මෙවැනි ලිවීම් මගින් ජීවත්වන සංක්‍රාන්ති සමාජභාවීය පුද්ගලයින්ට සිදුවිය හැකි හානිය කොතරම් දැයි අවබෝධයක් නොමැතිවීම හෝ එසේ සිදුවීම තැකීමක් නොවීම හෝ මෙවැනි වාර්තාකරණයන්ට හේතු විය හැකිය.

මීළඟ පරිච්ඡේදයෙන් ඔබට විවිධ ලිංගික අනන්‍යතා සහිත ප්‍රජාව සම්බන්ධව මාධ්‍ය වාර්තාකරණය සිදුකිරීමේදී අනුගමනය කළ යුතු දේවල් සම්බන්ධ උපදෙස් මාලාවක් ඉදිරිපත් කරනවා ඇත.

# විවිධ ලිංගික අනන්‍යතා සම්බන්ධ මාධ්‍ය වාර්තාකරණයට මාර්ගෝපදේශනයක්

මෙම මාර්ගෝපදේශනය මුද්‍රිත, විද්‍යුත්, ඩිජිටල් හා සමාජ යන ඕනෑම මාධ්‍යක් සඳහා අදාළ වන අතර මෙහි වාර්තාකරණය යනුවෙන් අදහස් කරන්නේ ඕනෑම ආකාරයක මාධ්‍ය ක්‍රියාකාරකමක් සම්බන්ධයෙනි. මාධ්‍යයට ලිවීම, අන්තර්ගත නිර්මාණයන්, සංස්කරණය කිරීම, සිරස්තල හා අනුමාතෘකා ලිවීම, වීඩියෝ කරණය, විශේෂාංග සකස් කිරීම යනාදී සියල්ල මෙමගින් ආවරණය වේ.

සමරිසි පුරුෂයින්, සමරිසි ස්ත්‍රීන්, ද්විරිසි පුද්ගලයින් හා සංක්‍රාන්ති සමාජභාවීය පුද්ගලයින්ටද තමන් සම්බන්ධ දේවල් හා තම ජීවිත සම්බන්ධයෙන් ලිවීමේදී නිවැරදි, අදාළ හා වැදගත් තොරතුරු වාර්තාකරණය වෙනවාද යන්න පිළිබඳ සොයාබැලීමට අයිතිය තිබේ. සමාජයේ අනෙකුත් සියලුම සාමාජිකයන්ට සලකනවා හා සමානවම විවිධ ලිංගික අනන්‍යතා සහිත ප්‍රජාව සම්බන්ධයෙන්ද විනිවිදභාවයකින් යුතුව, ගරුත්වයෙන් හා විශ්වසනීයත්වයෙන් යුතුව වාර්තාකරණය කිරීමට මාධ්‍යවේදීන් විසින් වග බලා ගත යුතුය. පසුගිය කාලසීමාවේදී විවිධ ලිංගික අනන්‍යතා සහිත ප්‍රජාව වෙනුවෙන් වැඩකරන ආයතන හා සංවිධානවල මැදිහත්වීම් මත මාධ්‍ය ක්ෂේත්‍රයේ යම් වෙනස්කම් සිදුවී තිබුණද, තවදුරටත් අවධානය යොමුකළ යුතු දේවල් පවතී. විශේෂයෙන් ලිවීමේදී යොදාගන්නා පාරිභාෂික වචන සම්බන්ධයෙන්, සංක්‍රාන්ති සමාජභාවීය ප්‍රජාව සම්බන්ධයෙන් පවතින වැරදි ආකල්ප සම්බන්ධයෙන් හා විහිළු හා අපහාස ඇතිකරවන ආකාරයට විවිධ ලිංගික අනන්‍යතා සහිත ප්‍රජාව අනුකරණය කරන නාට්‍ය, වාර්තා වැඩසටහන්, චිත්‍රපට, ගීතමය ජවනිකා, රූප රචනා ආදිය සම්බන්ධයෙන් අවධානය යොමු කළ යුතුවේ.

- විවිධ ලිංගික අනන්‍යතා සහිත ප්‍රජාවට අදාළ ප්‍රශ්න සම්බන්ධයෙන් වාර්තා කිරීමට ප්‍රථමව ඔවුන් "සමරිසි පුරුෂයින්", "සමරිසි ස්ත්‍රීන්" හෝ "සංක්‍රාන්ති සමාජභාවීය" අය ලෙස හැඳින්වීම සුදුසුදැයි ඔබෙන්ම අසන්න. ඔබ විසින් වාර්තා කරන කතාවට එම වචන යෙදීම අත්‍යාවශ්‍යම නැත්නම් කරුණාකර එවා නොදමා සිටින්න. පුද්ගලයෙකුගේ ලිංගික දිශානතිය හා ස්ත්‍රී පුරුෂ සමාජභාවීය අනන්‍යතාව සම්බන්ධ තත්ත්වයන් එම පුවතට අදාළම පමණක් නම් යොදාගන්න. පුද්ගලයින්ගේ ජීවිතවල ඇතුල් පැත්තට එබී බලමින් මාධ්‍යවේදියා විසින් සිදුකළ යුත්තේ එම පුද්ගලයාට යහපතක් කිරීම පමණි. ඔබගේ වාර්තාකරණයෙන් මහජන මතය වැරදි ලෙස වෙනස් කිරීම හෝ මහජන කැළඹීමක් ඇතිකිරීම හෝ කිසියම් පුද්ගලයෙකුගේ ලිංගික දිශානතිය හෝ ස්ත්‍රී පුරුෂ සමාජභාවීය අනන්‍යතාවයට මහජනතාව තුළින් වෛරයක් ඇතිකරවන ආකාරයේ දෙයක් සිදුවේ යැයි අංශු මාත්‍රයකින් හෝ අනුමාන කරන්නේ නම් කරුණාකර එම වාර්තාකරණයෙන් වළකින්න.

- විවිධත්වය වෙනුවෙන් පෙනී සිටින්න. වාර්තාකරණයේදී නිරවද්‍යභාවය තුලිත කිරීමට උත්සාහ කරන්න. විශේෂයෙන්ම සමරිසි ප්‍රජාව වැනි සමාජ සංවේදී මාතෘකා සම්බන්ධයෙන් වාර්තා කිරීමේදී මෙම තුලනය වැදගත් වේ.

- සමරිසි පුද්ගලයින්ගේ ප්‍රශ්නය ද්විරිසි පුද්ගලයින්ගේ ප්‍රශ්නයට වඩා වෙනස් විය හැකිය. සමරිසි පුරුෂයින්ට තිබෙන ප්‍රශ්නයෙන් සමරිසි කාන්තාවන්ගේ ප්‍රශ්නය වෙනස් විය හැකිය. සංක්‍රාන්ති සමාජභාවීය ප්‍රජාවගේ ප්‍රශ්නය මේ සියල්ලෙන් සම්පූර්ණයෙන් වෙනස් විය හැකිය. එම නිසා වාර්තාකරණයේදී LGBT යනු පොදු කුලකයක් නොවේ.

- ඔබට විවිධ ලිංගික අනන්‍යතා සම්බන්ධයෙන් පොදු සමාජය තුළ කතිකාවක් හෝ ප්‍රතිකතිකාවක් ඇති කරමින් යම් විවාදයක් නිර්මාණය කිරීමට අවශ්‍ය නම් කරුණාකර එක් එක් අය එවන ලද ලිපි යනාදී දේ පළ කිරීමෙන් වළකින්න. සමාජ මාධ්‍ය හරහා ලැබුණු ප්‍රතිචාර (Facebook Comments) වැනි දෑ උපුටා දැක්වීමෙන් වළකින්න. එසේත් නැතිනම් LGBT ප්‍රජාවට හානි දායක විය හැකැයි සිතෙන නීත්‍යානුකූල නොවන ප්‍රකාශන, දුරකථන සංවාද, ඡායාරූප, වීඩියෝ පට යනාදිය පළ කිරීමෙන් වළකින්න. කතිකාව මධ්‍යස්ථව මෙහෙයවන්න.

- භාෂාව භාවිතා කිරීමේදී LGBT ප්‍රජාවට අපහාසාත්මක ලෙස සමාජය විසින් නිර්මාණය කර ඇති විවිධ වචන භාවිතා නොකරන්න. මෙම පොත් පිංච සමඟ ඔබට නිවරැදි වචන මාලාව හා ඒවායෙන් අදහස් කෙරෙන්නේ කුමක්ද යන්න වෙනමම ලැබී ඇත. කරුණාකර එම වචන භාවිතා කරන්න. ලිවීමේදී විශේෂයෙන් පාඨකයාට කුතුහලය හෝ සමාජය තුළ ගැටුමක් නිර්මාණය වන ආකාරයේ හෝ අවසානයක් සිදු නොකරන්න.

- විද්‍යාත්මක හෝ සෞඛ්‍යමය (සායනික) සාකච්ඡාවකදී හැරෙන්නට "සමලිංගික" යන වචනය භාවිතා නොකරන්න. මෙම වචනය මගින් සමරිසි සම්බන්ධතා යනු ලිංගික සම්බන්ධතාය යන අදහස ගෙන දේ. එමෙන්ම මෙම වචනය යල් පැනගිය එකක් වන අතර යම් ආකාරයක මානසික වශයෙන් අසාමාන්‍ය යන අදහස ගෙන දේ. ඔබ සමාජ ප්‍රස්තුතයක් තුළදී සමලිංගික හෝ සංක්‍රාන්ති සමාජභාවීය ප්‍රශ්න සාකච්ඡා කරන්නේ නම් ඒ වෙනුවට LGBT, සමරිසි, ද්විරිසි, සංක්‍රාන්ති ලිංගික, අන්තර් ලිංගික, විවිධ ලිංගික අනන්‍යතා යනාදී වචන භාවිතා කරන්න.

- සම්බන්ධතා විස්තර කිරීමේදී "සමලිංගික සම්බන්ධතා", "සමලිංගික යුවළක්" යනාදී වශයෙන් දැක්වීමෙන් ඔබ නොදැනම අදාළ ප්‍රජාවගේ මානව හිමිකම් උල්ලංඝණය විය හැකිය. මේ නිසා කතාව ලියාගෙන යාමේදී "සම්බන්ධතාවක්" යනුවෙන් දැක්වීම ප්‍රමාණවත්ය. ඒ ද කතාවට අදාළ නම් පමණි.

  උදා: "මහපාරේ කම් සැප සෙවූ සමලිංගිකයින් දෙදෙනෙක් පොලිස් අත් අඩංගුවට......"
  මෙය "ප්‍රසිද්ධියේ අයුතු ලෙස හැසිරුණායි සැකපිට සමරිසි පුද්ගලයින් දෙදෙනෙකු පොලිස් අත් අඩංගුවට පත්වී ඇත." යනුවෙන් ලිවිය හැකිය.

- සමරිසි තේමාව යටතේ වාර්තාකරණයේදී "ලිංගික කැමැත්ත" යන වචනය භාවිතා නොකරන්න. එයට හේතුව සමරිසිභාවය සම්බන්ධ ජීව විද්‍යාත්මක හා මනෝ විද්‍යාත්මක සාධක එමගින් ආවරණය නොකරන බැවිණි. නිවැරදි පර්යාය පදය වන්නේ "ලිංගික දිශානතිය" යන්නයි. ඔබ ලිංගික කැමැත්ත යන වචනය යොදුවහොත් එමගින් ගම්‍ය වන්නේ සමරිසි වීම යනු නිදහස් තෝරාගැනීමක් වන බවයි.

- සමහර මාධ්‍ය වාර්තාකිරීම් වලදී දැකිය හැකි තවත් යෙදුමක් වන්නේ "සමලිංගික ජීවන චර්යාව" යන්නයි. සමරිසි පුද්ගලයින්ට අදාළව එවැනි විශේෂ ජීවන චර්යාවක් නොමැති අතර, සමහරවිට ඔවුන් අඳින, පළඳින ආකාරය හා හැසිරෙන ආකාරය යම් යම් පුද්ගලයින්ට අනුව වෙනස්විය හැකි වුවද සෑම දෙනාටම එක හා සමාන නොවේ.

- එමෙන්ම වාර්තාකරණයේදී දැකිය හැකි තවත් අවභාවිතයක් නම් කිසියම් පුද්ගලයෙකු පිළිබඳ සඝුව පැවසීමට බිය නිසා ව්‍යංග්‍යයෙන් එම පුද්ගලයා අවධාරණය කිරීමට උත්සාහ කිරීමයි. "මැණික් වලට ප්‍රසිද්ධ ප්‍රදේශය නියෝජනය කරන අමාත්‍යවරයෙක්............. මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වූ තරුණයෙකුට රඟපාන නළුවෙක්............." යනාදී වශයෙන් වෙනත් ආකාරයෙන් පාඨකයා තුළ කුතුහලය ඇතිකිරීම හා අදාළ පුද්ගලයා අනුමාන කිරීමට අවස්ථාව සැලසීමයි. එමගින් සිදුවන්නේ ඔබ ඉදිරිපත් කරන තොරතුරුවල වැදගත්කම පවා නැතිවී යාම පමණකි.

- වාර්තාකරණයේදී දේශපාලනික අර්ථ ගැන්වෙන වචන භාවිතා කිරීමේදී ප්‍රවේශම් වන්න. "සමලිංගික න්‍යාය පත්‍රය", "ලිංගික විපරීතයින්ගේ න්‍යාය පත්‍රය" යනාදී වචන භාවිතා කිරීමෙන් සිදුවන්නේ සමරිසියන් ඔවුන් ගේ අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී සිටීම අරගලයක් හෝ කැරැල්ලක් ලෙස සමාජය විසින් දැකිය හැකිවීමයි. සමරිසි පුද්ගලයින්ට හෝ විවිධ ලිංගික අනන්‍යතා වෙනුවෙන් වැඩකරන ආයතනයකට හෝ වෙන වෙනම න්‍යාය පත්‍ර නොමැත. මෙයට හේතුව ජාතිවාදය, යුද අපරාධ, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වැනි ප්‍රසිද්ධ මාතෘකා සමග සමරිසිභාවයද සම්බන්ධ කිරීමට උත්සාහ කිරීමයි. සමරිසිභාවය බටහිරින් පැමිණි දෙයක් යැයි විශ්වාස කරන අය විසින් මෙම මතය තවමත් සමාජය පුරා ව්‍යාප්ත කරමින් සිටී.

- සමරිසි පුද්ගලයින් ඇතුළු විවිධ ලිංගික අනන්‍යතා සහිත පුද්ගලයින්ගේ මානව අයිතිවාසිකම් ව්‍යාපාරය "සමලිංගිකයින් විසින් විශේෂ අයිතිවාසිකම් ඉල්ලා සිටියි" යනුවෙන් හැල්ලු කිරීමට උත්සාහ නොදරන්න. වාර්තාකරණයේදී බොහෝ මාධ්‍යවේදීන් මෙවැනි අදහසක් උලුප්පා පෙන්වීමට උත්සාහ දරනු පෙනේ. විශේෂ අයිතිවාසිකම් ඉල්ලා සිටී යන්නෙන් විවිධ ලිංගික

අනන්‍යතා සහිත ප්‍රජාව සමාජයේ තිබෙන සාමාන්‍ය අවශ්‍යතා සියල්ල සතුටින් භුක්තිවිඳී යන අදහස ඉස්මතු වේ. මෙම අදහස සමරිසි විවාහ අයිතිවාසිකම් ඉල්ලා සිටීම යන්න සමග බැඳී පවතින්නකි. ශ්‍රී ලංකාවේ සමරිසියන් විසින් ඉල්ලා සිටින්නේ විවාහ අයිතිවාසිකම් නොව "වෙනස් කොට සැලකීමෙන් තොරව ජීවත්වීමේ අයිතිය" බව සිහිතබාගෙන වාර්තාකරණයේ යෙදෙන්න.

- රජය, සමහර ජාතිවාදී හා මූලධර්මවාදී කණ්ඩායම්, සමරිසි භීතිකාවෙන් පෙළෙන කණ්ඩායම් විසින් සමරිසිභාවය හා ළමා අපචාර එකිනෙකට සම්බන්ධ කිරීමට උත්සාහ දරමින් සිටී. එය ඉතා අසත්‍ය මෙන්ම භයානක සම්බන්ධ කිරීමකි. ඉහතින්ද දැක්වූ ආකාරයට සමරිසි වීම හා ළමා අපචාර අතර කිසිදු සම්බන්ධයක් නොමැත. කරුණාකර ඔබගේ මාධ්‍යකරණයේදී එම අදහස දුර්වල කරනු විනා තහවුරු කිරීමට උත්සාහ නොකරන්න.

- සංක්‍රාන්ති සමාජභාවීය ප්‍රජාව සම්බන්ධ වාර්තාකරණයේදී ඉතාමත් පරිස්සම් විය යුතුය. සමහරවිට ජානමය හේතු නිසා විරුද්ධ ලිංගික ලක්ෂණ පවතින, ඇතැම්විට වෙනත් ආශාවන් නිසා විරුද්ධ ලිංගික ඇඳුම් අඳින අය සිටී. ඔවුන් සංක්‍රාන්ති සමාජභාවීය අය නොවිය හැකිය. එම නිසා සිදුවීම වාර්තාකරණයේදී ඔබ අදාළ පුද්ගලයාගේ අනන්‍යතාවය නිවැරදිව නොදන්නනේ නම්, කරුණාකර ඔවුන්ට අනන්‍යතාවක් දීමට යාමෙන් වළකින්න. "පිරිමින් වෙන්න හදන ගැහැණු", "ගැහැණුන් වෙන්න හදන පිරිමි" යනාදී වචන බොහෝ අවස්ථාවලදී මාධ්‍ය මගින් භාවිතා කරනු දැක ඇත්තෙමු. එමගින් සමාජය තුළ විවිධ ලිංගික අනන්‍යතා සහිත ප්‍රජාව සම්බන්ධයෙන් වෛරයක් හා පිළිකුලක් ඇතිවනවා විනා අදාළ වාර්තාවෙන් කිසිදු දැනුමක් ලබාගන්නේ නැත.

- "ලිංගික විපර්යාසය", "පූර්ව සැත්කම් අවස්ථාව", "පසු සැත්කම් අවස්ථාව" යනාදී වචන භාවිතා කිරීමේදී අතිශයින් ප්‍රවේශම් වන්න. සංක්‍රාන්ති සමාජභාවීය ප්‍රජාව සැත්කම් සිදුකිරීම මගින් අපේක්ෂා කරන්නේ තමන්ගේ මනසට දැනෙන පුද්ගලයාට අනුව ලිංගික අවයව හා ශරීරය සකස් කරගැනීම විනා ලිංගික අවයව මාරුකරගැනීමක් නොවේ. එමෙන්ම සෑම සංක්‍රාන්ති සමාජභාවීය පුද්ගලයෙක්ම හෝමෝන ප්‍රතිකාර ගැනීම හෝ, සැත්කම් සිදුකරගැනීම සිදුනොකරන අතර, එය මානසික කාරණයක් නිසා එසේ සිදුනොකර සිටින අයද සිටිති.

- වාර්තාකරණයේදී සෑමවිටම සංක්‍රාන්ති සමාජභාවීය පුද්ගලයා විසින් තමන්ව ආමන්ත්‍රණය කිරීමට කැමති වචනය යොදන්න. ආමන්ත්‍රණය කිරීමේදී "ඔහු/ඇය" යනාදී ලෙස යෙදිය හැකි සර්ව නාම පදය කුමක්දැයි අසා සිටින්න. එමෙන්ම මාධ්‍ය ලිපිවලදී දැකිය හැකි තවත් දෙයක් නම් සංක්‍රාන්ති සමාජභාවීය පුද්ගලයාගේ නම හෝ සර්ව නාම පදය "........." ආකාරයෙන් හෝ බෝල්ට් කිරීමෙන් දැක්වීමයි. අවශ්‍ය වන්නේ කතාන්දරය මිස නම හෝ සර්ව නාම පදය නොවේ.

- හැකි සෑම අවස්ථාවකදීම "සංක්‍රාන්ති සමාජභාවීය ගැහැණිය", "සංක්‍රාන්ති සමාජභාවීය පිරිමියා" යන වචන යොදන්න. තනි පදයක් ලෙස සංක්‍රාන්ති යන්න පමණක් යෙදීමෙන් වළකින්න. එමගින් පිටසක්වල ජීවියෙක් වැනි අදහසක් පාඨකයා තුළ ඇතිකරනු ඇත.

වඩාත් වැදගත් වන්නේ, පුද්ගලයින් රමණය කරන්නේ කා සමගද, ජීවත් වෙන්නේ කොහේද, කන්නේ බොන්නේ කෙසේද, කකුල් දෙක අතර තිබෙන අවයවය කුමක්ද යන්න සොයාබැලීම නොවේ. ඇති දේ ඇති සැටියෙන් වාර්තා කිරීමයි. ඔබගේ වාර්තා කිරීම මගින් විවිධ ලිංගික අනන්‍යතා සහිත ප්‍රජාව සමාජය තුළ සාමාන්‍යකරණය කිරීමයි. ඔවුන් පිළිබඳ සත්‍ය තොරතුරු මධ්‍යස්ථව ලිවීම මගින් ඔවුන්ට නිදහසේ ජීවත්විය හැකි සමාජ ක්‍රමයක් සකස් කිරීමට ඔබගේ නිර්මාණශීලී හැකියාව යොදාගැනීමයි.

සමරිසි පුද්ගලයින් ඇතුළු විවිධ ලිංගික අනන්‍යතා සහිත ප්‍රජාව සම්බන්ධව ලිවීමට, පර්යේෂණය කිරීමට, වාර්තා නිර්මාණය කිරීමට ආදී සියලුම කාර්යයන් සඳහා අවශ්‍ය සහයෝගය ලබාදීමට EQUAL GROUND ආයතනය සූදානමින් සිටී. EQUAL GROUND ආයතනය සතුව ඉතා දුර්ලභ ගණයේ පුස්තකාලයක් හා චිත්‍රපට සංරක්ෂණයක් පවතින අතර ඒවා පරිශීලනය කිරීමට ඔබට හැකිය. එමෙන්ම EQUAL GROUND ආයතනය සමග ස්වේච්ඡාවෙන් සම්බන්ධ වීමට හා ඔවුන් සමග වැඩ කිරීමට ඔබට අවශ්‍යයි නම්, ඒ බවද කරුණාකර අපට දන්වන්න. සියලුම ලිංගික අනන්‍යතාවන්ගෙන් යුතු අයට මානව හිමිකම් ලබාදීම හා සුරක්ෂිත කිරීම සඳහා අප විසින් ගෙන යනු ලබන වෑයමට ඔබගේ ශක්තිය ලබාදෙන්න.

EQUAL GROUND ආයතනය සම්බන්ධකරගැනීමට පහත ඊමේල් හා දුරකථන මාධ්‍යයන් අමතන්න.
equalground@gmail.com / media@equalgroundsrilanka.com / 011-4334277 / 011-4334278

EQUAL GROUND

ආයතනයේ ප්‍රකාශනයකි.

Tel : +94-11- 5679766/+94-11-2806184
Fax: +94-11-2805704
Web: http://www.equal-ground.org
Web Blog: http://equalground.wordpress.com

**"EQUALITY FOR ALL SEXUAL ORIENTATIONS AND GENDER IDENTITIES: HUMAN RIGHTS FOR EVERYONE"**